# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2024

කම්කරු දෙපාර්තමේන්තුව

தொழில் திணைக்களம்

Department of Labour



# 2024 වර්ෂය සඳහා

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

## වැය ශීර්ෂ අංක 221

## කම්කරු දෙපාර්තමේන්තුව

# .පෙළගැස්ම

පිටුව


| | | |
|---|---|---|
| **පළමු පරිච්ඡේදය**<br>ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය | | **6** |
| 1.1 | හැඳින්වීම | 7 |
| 1.2 | දැක්ම, මෙහෙවර සහ අරමුණු | 7 |
| 1.3 | ප්‍රධාන කාර්යයන් | 7 |
| 1.4 | දෙපාර්තමේන්තුවේ ව්‍යුහය සහ ප්‍රධාන අංශ | 8 |
| 1.5 | දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් | 18 |
| **දෙවන පරිච්ඡේදය**<br>ප්‍රගතිය හා ඉදිරි දැක්ම | | **19** |
| 2.1 | සේවකයන්ගේ සමාජ ආරක්ෂණය | 20 |
| 2.2 | ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම | 22 |
| 2.3 | කාර්මික සම්බන්ධතාවය | 24 |
| 2.4 | සේවකයන් සේවයේ යෙදවීමට අදාළ අයිතීන් ආරක්ෂා කර දීම සඳහා නෛතික රැකවරණය | 28 |
| 2.5 | ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම | 29 |
| 2.6 | සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම | 31 |
| 2.7 | සේවකයාගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා වූ සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම | 35 |
| 2.8 | සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් | 37 |
| 2.9 | දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය | 39 |
| 2.10 | දෙපාර්තමේන්තුවේ නිල සමාජ මාධ්‍ය කටයුතු | 39 |
| 2.11 | කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය | 39 |
| 2.12 | තොරතුරු සන්නිවේදන කටයුතු | 40 |
| 2.13 | දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණය | 43 |
| 2.14 | දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය | 46 |
| 2.15 | දෙපාර්තමේන්තුවේ කාර්යයන් අධීක්ෂණය මඟින් ඉලක්කයන් කරා මෙහෙයවීම | 46 |
| 2.16 | මූල්‍ය කළමනාකරණය | 47 |

| | | |
|---|---|---|
| **තුන්වන පරිච්ඡේදය**<br><br>**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය** | | **49** |
| 3.1 | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 50 |
| 3.2 | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 51 |
| 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 53 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 54 |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය | 55 |
| 3.6 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය | 55 |
| 3.7 | මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 56 |
| 3.8 | මුදල් නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය | 57 |
| 3.9 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 58 |
| **සිව්වන පරිච්ඡේදය**<br>කාර්යසාධන දර්ශක | | **65** |
| 4.1 | ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 66 |
| **පස්වන පරිච්ඡේදය**<br>තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | | **67** |
| 5.1 | හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු | 68 |
| 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ | 69 |
| 5.3 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග | 74 |
| **සයවන පරිච්ඡේදය**<br>මානව සම්පත් පැතිකඩ | | **75** |
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 76 |
| 6.2 | ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය | 76 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 66 |
| **හත්වන පරිච්ඡේදය**<br>අනුකූලතා වාර්තාව | | **87** |
| 7.1 | අනුකූලතා වාර්තාව | 88 |

# ප්‍රස්තාර


| | | පිටුව |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාව | **20** |
| ප්‍රස්තාරය 2.2 | 2019 වර්ෂයේ සිට 2024.12.31 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් | 24 |
| ප්‍රස්තාරය 2.3 | 2019 වර්ෂයේ සිට 2024.12.31 දක්වා කාර්මික ආරාවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් | **24** |
| ප්‍රස්තාරය 2.4 | මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | 28 |


# වගු


| | | පිටුව |
|---|---|---|
| වගුව 2.1 | වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2024.01.01 සිට 2024.12.31 දක්වා | 26 |
| වගුව 2.2 | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් | 34 |
| වගුව 2.3 | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කර්මාන්තමය සුරක්ෂිතතා අංශය විසින් පවත්වන ලද සේව්‍ය සේවක දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු | 36 |
| වගුව 2.4 | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාල සීමාව තුළ දී වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් විවිධ ආයතන තුළ ඇතිවූ ගැටළුකාරී තත්ත්වයන් විසඳීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග | 37 |
| වගුව 2.5 | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වෘත්තීය ස්වස්ථතා අංශය විසින් සිදු කරන ලද සේව්‍ය සේවක දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු | 38 |
| වගුව 6.1 | දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2024 | 77 |
| වගුව 6.2 | විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2024 | 85 |

# රූප සටහන්

පිටුව


| | | |
|---|---|---|
| රූප සටහන 2.1 | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා නිවේදන යැවීමේ ප්‍රගතිය | 21 |
| රූප සටහන 2.2 | පරීක්ෂණ සිදු කිරීම් - 2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය | 23 |
| රූප සටහන 2.3 | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාල සීමාව තුළ දී ඉටු කරන ලද ක්‍රියාකාරකම් | 37 |


# ඡායාරූප

පිටුව


| | | |
|---|---|---|
| ඡායාරූපය 2.1 | කාර්මික සංහිඳියාව සඳහා වන විශිෂ්ටතා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයේ ඡායාරූපයක් - 2024.11.06 | 27 |
| ඡායාරූපය 2.2 | අවිස්සාවේල්ල ප්‍රජා පොලිස් කොට්ඨාසය මගින් සංවිධානය කල වැඩසටහනෙහි ඡායාරූපයක් - 2024.12.27 | 32 |

# පළමු පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 ආයතනය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාව වෙත කම්කරු නීති මගින් හිමිකර දී ඇති අයිතිවාසිකම් තහවුරු කිරීම සහ සේව්‍ය - සේවක සබඳතාවය ප්‍රවර්ධනය කිරීම තුළින් සහ ආයතන මට්ටමින් කාර්මික සාමය සුරක්ෂිත කිරීම තුළින් සුනිසි වැඩ පරිසරයක් ඇති කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ.

කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිය සේවාලාභීන් වෙත සේවා සැපයීමේදී තවදුරටත් කාර්යක්ෂම විය යුතු ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමටත් ඒ සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග හඳුනා ගැනීමටත් අදාළ ක්‍රියාකාරකම් කෙරෙහි මූලික අවධානය යොමු කර 2024 වර්ෂයේදී විශේෂ ක්‍රියාකාරකම් රාශියක් සිදු කරන ලදී. මේ සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගෙන් සමන්විත කමිටු පිහිටුවා යෝජනා සහ නිර්දේශ ලබා ගැනීමත් යෝග්‍ය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමත් සිදු කරන ලදී.

## 1.2 කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

| දැක්ම | මෙහෙවර |
|---|---|
| අන්තර්ජාතිකව තරගකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක් | කම්කරු අයිතීන් ආරක්ෂා කරමින්, තහවුරු කරන ලද කාර්මික සාමය සහිත සුනිසි වැඩ පරිසරයක් තුළින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම |
| **අරමුණු** | |
| • පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා ආයතන තුළ ස්ථිරසාර කාර්මික සාමය තහවුරු කිරීම<br>• සුනිසි වැඩ පරිසරයක් ඇති කිරීම හා ශ්‍රම ප්‍රමිතීන් සකස් කිරීම මගින් සේවකයන්ගේ සේවා තත්ව වැඩි දියුණු කිරීම<br>• සේවකයන්ගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම<br>• ස්ත්‍රීන් හා තරුණ අයගේ වෘත්තීමය සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ළමා ශ්‍රමය තුරන් කිරීම<br>• සේවකයන්ගේ සෞඛ්‍ය තත්වයන්ට හිතකර හා අනතුරු රහිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීම | |


## 1.3 කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

- සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම මගින් ආයතන මට්ටමින් සේව්‍ය-සේවක සබඳතාවය ශක්තිමත් කිරීම
- කම්කරු නීති ක්‍රියාත්මක කිරීම තුළින් සේවක අයිතීන් ආරක්ෂා කිරීම

- සමථ කිරීම, සාමූහික ගිවිසුම් සහ බේරුම්කරණය ආදී ක්‍රම මගින් කාර්මික ආරාවුල් නිරවුල් කිරීම
- සේවක අර්ථසාධක අරමුදල මගින් සේවකයින්ගේ සමාජ ආරක්ෂණය සඳහා කටයුතු කිරීම
- සේවකයින්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය සම්බන්ධයෙන් කටයුතු කිරීම
- ළමා ශ්‍රමය තුරන් කිරීම
- සේවයේ නියුක්ත කාන්තාවන්ගේ සහ තරුණ අයගේ වෘත්තීමය සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් කටයුතු කිරීම
- වැටුප් හා සේවා කොන්දේසි ශක්තිමත් කිරීම මගින් ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ තීරණ ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම, විශ්ලේෂණය කිරීම සහ අවශ්‍යතාවය පරිදි ප්‍රකාශයට පත් කිරීම

## 1.4 දෙපාර්තමේන්තුවේ ව්‍යුහය සහ ප්‍රධාන අංශ

### 1.4.1 කම්කරු දෙපාර්තමේන්තුවේ ව්‍යුහය



### 1.4.2 කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

| | |
|---|---|
| ✓ කාර්මික සම්බන්ධතා අංශය | ✓ සේවක අර්ථසාධක අරමුදල් අංශය |
| ✓ සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධන අංශය | ✓ නීති ක්‍රියා අංශය |
| ✓ විශේෂ විමර්ශන අංශය | ✓ පාලන අංශය |
| ✓ ශ්‍රම ප්‍රමිති අංශය | ✓ මුදල් අංශය |
| ✓ කර්මාන්තමය සුරක්ෂිතතා අංශය | ✓ සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය |
| ✓ වෘත්තීය ස්වස්ථතා අංශය | ✓ සංඛ්‍යාලේඛන අංශය |
| ✓ කාන්තා හා ළමා කටයුතු අංශය | ✓ අභ්‍යන්තර විගණන අංශය |

### 1.4.3 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශයන්හි කාර්යභාරය

#### 1.4.3.1 කාර්මික සම්බන්ධතා අංශය

සේවක අයිතීන් ආරක්ෂා කරමින් රට තුළ කාර්මික සාමය ඇතිකර රටේ ආර්ථික වර්ධනයට සහ සංවර්ධනයට දායක වීමේ වගකීම කාර්මික සම්බන්ධතා අංශය මගින් දරනු ලබයි. මේ සඳහා කාර්මික සම්බන්ධතා අංශය යටතේ සේවය අවසන් කිරීමේ අංශය සහ වෘත්තීය සමිති අංශය ක්‍රියාත්මක වන අතර කාර්මික අධිකරණයේ සම්බන්ධීකරණ කටයුතු ද සිදු කරනු ලබයි.

ඒ අනුව, ආර්ථික ඵලදායීතාවය නංවාලීම සඳහා අවශ්‍ය කාර්මික සාමය ඇති කිරීම, කම්කරු අණපනත් වලින් නියමකර ඇති සේවා කොන්දේසි හා සේවා තත්ත්වයන් ආරක්ෂා කිරීම, සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම හා ප්‍රවර්ධනය කිරීම, වැඩ වර්ජන හා කාර්මික ආරාවුල් අවම කිරීම සහ වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම හා නියාමනය කිරීම මෙම අංශයේ ප්‍රධාන අරමුණු වේ.

මෙම අංශය මගින් පහත නෛතික විධිවිධාන බලාත්මක කරනු ලබයි.

- 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත
- 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත
- 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
- 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත
- 2021 අංක 28 දරන සේවකයන් විශ්‍රාම යාමේ අවම වයස පනත

### 1.4.3.2 සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධන අංශය

දිවයින පුරා විසිරී ඇති පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල උපරිම ඵලදායීතාව හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීම සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධන අංශය මගින් සිදු කෙරේ. ඒ අනුව එම අංශය විසින් පහත කටයුතු සිදු කරනු ලබයි.

- සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති හා උපාය මාර්ග හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනික මට්ටමෙන් වැඩපොළ සහයෝගීතාව ගොඩනැගීම
- සාමූහික ගිවිසුම් ඇති කිරීම සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියා කරමින් කාර්මික සාමය ගොඩනැගීම
- යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් සේවා සේවක දෙපාර්ශවය කම්කරු නීති පිළිබඳව දැනුම්වත් කිරීම
- සේවා සේවක දෙපාර්ශවයේ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ සහභාගිත්වයෙන් ප්‍රාදේශීය කම්කරු කාර්යාල හරහා ත්‍රෛපාර්ශවීය සබඳතාවය ගොඩනැගීම, ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීම, දැනුම බෙදා හදා ගැනීම සහ සේවා සේවක දෙපාර්ශවය අතර පවතින ගැටලු නිරාකරණය කිරීම සඳහා කලාප / දිස්ත්‍රික් උපදේශන සභා සහ සමාජ වේදිකා වැඩසටහන් පැවැත්වීම
- සමාජ කතිකාව සහ වැඩපොළ සහයෝගිතාවය ප්‍රවර්ධනය සඳහා සහ දැනුම වර්ධනය කිරීම සඳහා සඟරා එළි දැක්වීම

### 1.4.3.3 විශේෂ විමර්ශන අංශය

යම් පැමිණිල්ලක් විභාග කිරීම හෝ විමර්ශනය කිරීම විශේෂ විමර්ශන අංශය විසින් සිදු කළ යුතු යැයි කම්කරු කොමසාරිස් ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවන්හිදී, එම පැමිණිළි සම්බන්ධයෙන් පරීක්ෂණ විශේෂ විමර්ශන අංශය විසින් සිදු කරනු ලැබේ.

කම්කරු කාර්යාලයක විභාග කරනු ලැබූ හෝ විභාග කරමින් පවතින පැමිණිල්ලක් විමර්ශනය කරනු ලබන ආකාරය සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවන සේවකයකුට හෝ සේවායෝජකයෙකුට පැමිණිල්ල සම්බන්ධයෙන් නැවත විමර්ශනයක් සිදු කරන ලෙසට විශේෂ විමර්ශන අංශයෙන් ඉල්ලීමක් කළ හැකිය.

කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝගය ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ සේවා-සේවක සම්බන්ධතා පවතින ආයතනයක කාර්මික ආරවුලක් ඇති ඕනෑම අවස්ථාවක, කම්කරු පරීක්ෂණයක් සිදු කිරීමේ බලතල විශේෂ විමර්ශන අංශය සතු වේ.

### 1.4.3.4 ශ්‍රම ප්‍රමිති අංශය

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුබසාදනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබා දීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයකි. සේවා තත්ත්වයන් හා කොන්දේසිවලට අදාළව පැන නගින ගැටලු නිරාකරණය කරගැනීමෙහිලා ඊට අදාළ පැහැදිලි කිරීම් ලබා දීම ද, ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමෙහිලා ඇති ප්‍රගතිය මෙන්ම අධීක්ෂණ කාර්ය ද ඉටු කිරීම මගින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීම මෙම කාර්යාවලියේ අත්‍යවශ්‍ය කොටසක් වන අතර, මෙම සමස්ත වගකීම ඉටු කිරීම දෙපාර්තමේන්තුවේ ශ්‍රම ප්‍රමිති අංශය විසින් සිදු කරනු ලබයි.

මෙම අංශය මගින් පහත නෛතික විධිවිධාන බලාත්මක කරනු ලබයි.

- ✓ 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
- ✓ 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත
- ✓ 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත
- ✓ 2016 අංක 03 දරන ජාතික අවම වේතන පනත
- ✓ 2016 අංක 04 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත

### 1.4.3.5 කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

කර්මාන්තශාලා තුළ සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම්, විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය හා ශබ්දය මගින් ශාරීරික හානි හෝ මරණය පවා සිදුවීමේ අවධානමක් පවතී. එබැවින්, අනතුරු ඇති වීම අවම කිරීම කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ වගකීම වේ. ලංකාවේ කර්මාන්තශාලාවල සේවය කරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුබසාදනයට අදාළ ප්‍රධානම නීතිමය මෙවලම් වනුයේ 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත හා එයට අනුකූලව සම්මතකර ඇති රෙගුලාසි ය. උපද්‍රව රහිත සේවා පරිසරයක් ඇති කිරීම තුළින් අනතුරු පිළිබඳ බියකින් තොර ආරක්ෂිත ශ්‍රම බලකායක් බිහි කිරීම මගින් සේවා ස්ථානවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත්, එමගින් දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමත්, ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය ඉහළ නැංවීමත් අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පිහිටුවා ඇති දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10හි සේවයේ නියුතු ඉංජිනේරුවන් විසින් කර්මාන්තශාලා පරීක්ෂා කර මෙම කාර්ය ඉටු කරනු ලබන අතර, කම්කරු නිලධාරීන් විසින් කරනු ලබන කම්කරු පරීක්ෂණවල දී හඳුනා ගැනෙන අනතුරුදායක තත්ත්වයන් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල වෙත වාර්තා කරනු ලබන හෙයින් එම තොරතුරු ද භාවිත කොට සේවක ආරක්ෂාව සැලසීම කරනු ලබයි.

මූලික වශයෙන් කර්මාන්තමය සුරක්ෂිතතාව සැලසීම සඳහා පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

- නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම
- ගොඩනැගිලි පිඹුරුපත් පරීක්ෂා කිරීම හා අනුමත කිරීම
- කර්මාන්තශාලා පරීක්ෂා කිරීම
- අනතුරු විමර්ශනය සහ අන්තරාදායී සිදුවීම් විමර්ශනය
- නීතිමය පියවර ගැනීම
- අධිඅන්තරාදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය කිරීම
- පැමිණිලි විමර්ශනය
- දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම
- වෘත්තීය අනතුරු හා ලෙඩ රෝග වලට ගොදුරුවන්නන් කම්කරු වන්දි කොමසාරිස් හා ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීම
- කම්කරු දෙපාර්තමේන්තුවේ හා අමාත්‍යාංශයේ ඉංජිනේරුමය කටයුතු ඉටු කිරීම
- වෙනත් වැඩසටහන්

### 1.4.3.6 වෘත්තීය ස්වස්ථතා අංශය

බලපවත්නා කර්මාන්තශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂාවන පරිදි සේවාස්ථානයේ පරිසරය සැකසීම සේවායෝජකයාගේ අනිවාර්ය වගකීමක් වන අතර, ආරක්ෂිත සේවා පරිසරයක සේවය කිරීමට සේවකයන්ට හිමිකමක් ඇත.

වෘත්තියෙහි නිරතවීමේ දී සේවා පරිසරයේ දුර්වලතා මත ශ්‍රමිකයන් රෝග තත්ත්වයනට ගොදුරුවීමේ අවධානම හා හදිසි අනතුරුවලට ගොදුරු වීම අවම කිරීම මගින් වෘත්තිකයන්ට ලබා දිය හැකි ඉහළම කායික, මානසික, සමාජීය හා ආධ්‍යාත්මික සුබසාදනය සහිත පරිසරයක් සේවා පියස තුළ ඇති කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන දැනුම ලබා දීම හා සේවා පියස තුළ ඇති තත්ත්ව පරීක්ෂාවට ලක් කිරීම වෘත්තීය ස්වස්ථතා අංශයේ මෙහෙයුම් ක්‍රියාවලිය වේ.

මූලික වශයෙන්ම සේවා පරිසරයේ යම් දුර්වලතා මත ක්ෂණිකව හෝ දීර්ඝ කාලීන වශයෙන් ශ්‍රමිකයන් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු විය හැකි තත්ත්වයන් පවතින්නේද යන්න විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ සොයා බැලීම, එමගින් ඇති විය හැකි සෞඛ්‍ය ගැටලු ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රමාණනය කිරීම පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේද යටතේ සිදුකිරීම, එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වලක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම්වත් කිරීම සිදුකරනු ලබයි.

මෙම අංශය මගින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

- සේවා ස්ථාන වල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම

- සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව ආරක්ෂා කිරීමට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම
- වෘත්තීය ස්වස්ථතා කරුණු මත වන්දි ඉල්ලුම් කරන අය පිළිබඳ, රෝගී තත්ත්වය ඇති වීම හා සේවා ස්ථානයේ තත්ත්වයන් පිළිබඳව අධිකරණයේදී සාක්ෂි ලබා දීම
- සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙතින් අරමුදල් අයදුම්කරන, සේවය කිරීමට නොහැකිවන පරිදි රෝගී තත්ත්වයනට පත්වූ සේවකයන්ගේ රෝග තත්ත්ව තක්සේරු කිරීම

### 1.4.3.7 කාන්තා හා ළමා කටයුතු අංශය

ශ්‍රී ලාංකීය ශ්‍රම බලකාය තුළ කාන්තා දායකත්වය ඉහළ නැංවීම හා ළමා ශ්‍රමය මුළුමනින්ම තුරන් කිරීම ශ්‍රී ලංකා රජයේ අත්‍යවශ්‍ය වගකීමක්ව පවතින අතර, මෙය කාන්තා හා ළමා කටයුතු අංශයේ කාර්යයන්හි මූලික දෙවැදෑරුම් වගකීම බවට පත්ව තිබේ.

ඒ අනුව, වැඩ බිමෙහි කාන්තාවන් ආවරණය වන කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මගින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම මෙම අංශයේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.

එසේම, සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය සහිතව ළමා ශ්‍රමය තුරන් කිරීම, වයස අවුරුදු 18ට අඩු පුද්ගලයන් සඳහා වන කම්කරු නීති ක්‍රියාත්මක කිරීම, වර්තමාන සමාජ ආර්ථික තත්වයන්ට අදාළව පවත්නා නීතියෙහි කළයුතු සංශෝධනයන් නිර්දේශ කිරීම ද මෙම අංශයේ ප්‍රමුඛ වගකීම් වේ.

ඒ අනුව, මෙම අංශය විසින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

- රැකියාවන්හි නිරත කාන්තාවන් හා තරුණ අය කෙරෙහි අදාළ වන්නාවූ පනත්හි විධිවිධාන ක්‍රියාවට නැගීම හා ඒ සඳහා ප්‍රාදේශීය කම්කරු කාර්යාල මෙහෙයවීම
- කාන්තාවන්ට හා ළමුන්ට අදාළ කම්කරු නීති රීති සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් දීප ව්‍යාප්තව සිදු කිරීම
- රැකියාවන්හි නියුතු කාන්තාවන්ට හා ළමුන්ට අදාළව පවත්නා නීතිය අධ්‍යයනය කර දුර්වලතා හා ඌනතා හඳුනාගෙන නීතිය ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම
- ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය යන මට්ටම් වලින් පවත්වනු ලබන ළමා සංවර්ධන කමිටු වලදී සඵල දායකත්වයක් ලබා දීම
- රැකියාවල නියුතු කාන්තාවන් සඳහා නිදහස් වෙළඳ කලාපයන්හි පිහිටුවා ඇති කම්කරු දෙපාර්තමේන්තුවට අයත් කාන්තා නේවාසිකාගාර නඩත්තු කිරීම
- සියලු ආකාර ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාතික හා ජාත්‍යන්තර වගකීම ඉටු කිරීම

එසේම, මෙම අංශය මගින් පහත නෛතික විධිවිධාන බලාත්මක කෙරනු ලබයි.

- ✓ 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත
- ✓ 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත
- ✓ 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ අදාළ කොටස්

### 1.4.3.8 සේවක අර්ථසාධක අරමුදල් අංශය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ ශ්‍රමිකයන්ට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුමකර දීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. වරින් වර සංශෝධනය වූ මෙම පනත යටතේ මේ වන විට ඉටුකරනු ලබන කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවායෝජකයින් ලියාපදිංචි කිරීම
- සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම
- දායක මුදල් නොගෙවන සේවායෝජකයන්ගෙන් දායක මුදල් අයකර ගැනීම
- සාමාජිකයන්ට හිමි ප්‍රතිලාභ මුදල් ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් නියෝග ලබාදීම
- සාමාජිකයාගේ සේවක අර්ථසාධක අරමුදල් තැන්පතු ඇපයට තබා අදාළ බැංකු වෙතින් නිවාස අරමුණු සඳහා ණය ලබා ගැනීම සඳහා ඉදිරිපත් වන ඉල්ලීම් නිර්දේශ කිරීම
- පෞද්ගලික ආරක්ෂක සේවා ආයතන සඳහා ආරක්ෂක බලපත්‍රය ලබා ගැනීමට නිශ්කාෂණ වාර්තා ලබා දීම.
- නිවාස කාර්යය හෝ වෛද්‍ය ප්‍රතිකාර කාර්යය සඳහා සාමාජිකයාගේ ගිණුමේ ශේෂයෙන් 30% දක්වා මුදල් ගෙවීම සඳහා ගෙවීම් නියෝග ලබාදීම
- අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය කිරීම

### 1.4.3.9 නීති ක්‍රියා අංශය

කම්කරු නීති දිවයින පුරා වඩාත් ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීම තුළින් කාර්මික සාමය තහවුරු කිරීමේ දැක්මෙන් යුතුව කම්කරු දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියා අංශය ක්‍රියාත්මක වේ. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවිය යුතු අණ පනත්හි ප්‍රතිපාදන දිවයින පුරා ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සඳහා එම නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ

ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේවා සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේවා සේවක සහයෝගීතාවය වර්ධනය කිරීමත් දෙපාර්තමේන්තුවේ නීති ක්‍රියා අංශය විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, නීති ක්‍රියා අංශයේ මූලික කාර්යයන් පහත පරිදි දැක්විය හැකිය.

- ව්‍යවස්ථාපිත කම්කරු නීති උල්ලංඝනය වීමකදී ඊට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට අදාළ කාර්යයන් ඉටු කිරීම හා එම නඩු මෙහෙයවීම
- දිසා අධිකරණ, වාණිජ මහාධිකරණයේ, පළාත්බද මහාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ කම්කරු දෙපාර්තමේන්තුවට එරෙහිව හෝ දෙපාර්තමේන්තුව විසින් පවරනු ලබන නඩු සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය සම්බන්ධීකරණය පවත්වා ගැනීම
- කලාප කාර්යාල අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මගින් සිදු කරනු ලබන අධිකරණමය ක්‍රියාවන් අධීක්ෂණය කිරීම, අවශ්‍ය උපදෙස් ලබා දීම හා එම අධිකරණමය ක්‍රියාවන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීම
- කලාපය තුළ පවත්නා දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලවල; අධිකරණ ක්‍රියාවලියේදී හා අක්‍රිය නඩු සක්‍රීය කිරීමේ ක්‍රියාවලියේදී අවශ්‍ය උපදෙස් ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවලදී දෙපාර්තමේන්තුව වෙනුවෙන් නඩු මෙහෙයවීම කලාප කාර්යාලවලට අනුයුක්ත නීති නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි
- කම්කරු නීති සංශෝධනයට අදාළ කටයුතුවලදී කම්කරු දෙපාර්තමේන්තුව පාර්ශවයෙන් ඉටු කළ යුතු වගකීම් ඉටු කිරීම සම්බන්ධීකරණය කිරීම

### 1.4.3.10 පාලන අංශය

පාලන අංශය ශාඛා 04කින් සමන්විත වේ. පාලන ශාඛාව, ආයතන ශාඛාව, ගොඩනැගිලි නඩත්තු ඒකකය සහ පුස්තකාලය එම ශාඛා වේ.

පාලන ශාඛාව මගින් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදිකිරීමට අදාළව ඉඩම් අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඉඩම් අත්පත් කර ගැනීම, ගොඩනැගිලි ඉදි කිරීමේ කටයුතු මෙහෙයවීම, ගොඩනැගිලි වැඩි දියුණු කිරීමට අදාළ කටයුතු මෙහෙයවීම, අවශ්‍යතාවය පරිදි ගොඩනැගිලි කුලියට ලබා ගැනීම, දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය, දෙපාර්තමේන්තුවේ අංශ සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, ප්‍රාග්ධන භාණ්ඩ හා උපකරණ කළමනාකරණය, අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම ආදී කටයුතු සිදු කරනු ලබයි.

ආයතන ශාඛාව මගින් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සම්බන්ධ සියලු කටයතු, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්යසාධනය ඇගයීම්, වැටුප් වර්ධක ලබා දීම්, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම

ගැන්වීම්, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු, කාර්ය මණ්ඩලයේ විනය කටයුතු ආදී කාර්ය මණ්ඩලයේ විෂයයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

ගොඩනැගිලි නඩත්තු ඒකකය මගින් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි ඉදිකිරීමට සහ ගොඩනැගිලි නඩත්තු කිරීමට අදාළ කටයුතු සම්බන්ධයෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සඳහා සහය වීම, ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණ කටයතු සිදු කිරීම, ගොඩනැගිලි වැඩි දියුණු කිරීමට අදාළ කටයුතු අධීක්ෂණය මෙන්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල සියලුම නඩත්තු කටයුතු සම්බන්ධයෙන්ද කටයුතු කරනු ලබයි.

කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණ පනත්, පොත්පත් හා ප්‍රකාශන එකතුවක් පවතින ශ්‍රී ලංකාවේ ප්‍රධානතම පුස්තකාලය කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය වේ. මෙමගින් කම්කරු දෙපාර්තමේන්තුවේ, කම්කරු අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා මෙන්ම බාහිර පාඨකයන් සඳහා ද කම්කරු නීති ක්ෂේත්‍රයට අදාළ සියලුම අණ පනත්, පොත් පත්, ප්‍රකාශන ආදිය පරිශීලනය සඳහා පහසුකම් සලසනු ලබයි.

### 1.4.3.11 මුදල් අංශය

කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරකම් සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා සහ අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම සඳහා භෞතික සම්පත් මෙන්ම මූල්‍ය සම්පත් ද අත්‍යවශ්‍ය සාධකයකි. ඒ අනුව, වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව, සඵලදායීව හා පිරිමැසුම්දායීව පරිපාලනය කිරීම මුදල් අංශය විසින් සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පරිපාලනය කාර්යක්ෂමව සහ විනිවිදභාවයෙන් සිදුකිරීම උදෙසා මුදල් අංශය පහත පරිදි ක්‍රියාත්මක වේ.

- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම හා එය ක්‍රියාත්මක කිරීම
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබා ගන්නා ලද භාණ්ඩ හා සේවා නිසි පරිදි බෙදාහැරීම
- ප්‍රාදේශීය කාර්යාල සඳහා අග්‍රිම නිකුත් කිරීම හා එම කාර්යාලවල මූල්‍ය අධීක්ෂණය
- මාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම හා අදාළ පාර්ශවයන් වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම
- බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන සියලුම ලැබීම් හා ගෙවීම් කටයුතු නීතිරීති ප්‍රකාරව මෙහෙයවීම
- දෙපාර්තමේන්තුව සතු ප්‍රාග්ධන වත්කම් සමීක්ෂණය හා අපහරණ කටයුතු
- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ වැටුප්, ණය අත්තිකාරම් හා දීමනා ගෙවීම

### 1.4.3.12 සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම හා උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සහ ඒ යටතේ වන ඉලක්කයන්ට අදාළව දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් හා ප්‍රාදේශීය කාර්යාල මෙහෙයවීමේ කටයුතු සම්බන්ධීකරණය, දෙපාර්තමේන්තුවේ අංශයන්හි ප්‍රගතිය සහ ඉදිරි කටයුතු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පවත්වනු ලබන ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගේ මාසික රැස්වීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම, රේඛීය අමාත්‍යාංශය විසින් ප්‍රගති සමාලෝචනය සඳහා මාසිකව පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය සකස් කිරීම සහ එම රැස්වීමේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, රේඛීය අමාත්‍යාංශය හා අනෙකුත් අමාත්‍යාංශ මගින් ඉල්ලුම් කරනු ලබන දත්ත හා වාර්තා සැපයීම සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ සැලසුම් හා ප්‍රගති සමාලෝචන කාර්යභාරය වේ.

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු මෙහෙයවීමේ වගකීම ද මෙම අංශය මගින් දරනු ලබයි. ඒ යටතේ, ප්‍රාදේශීය කාර්යාලයන්හි වාර්ෂික ප්‍රගති සමාලෝචන සැලැස්ම සකස් කිරීම හා අධීක්ෂණය සිදු කරනු ලබන අතර එහිදී, කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් මගින් එක් එක් කලාපයන්හි ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කිරීම මෙන්ම අංශය මගින් අධීක්ෂණ කණ්ඩායම් යොමු කර එක් එක් කාර්යාලයන්හි ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමද සිදු කරනු ලබයි.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර ඉටු කර ගැනීම සඳහා සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මෙන්ම දෙපාර්තමේන්තුවේ සියලු අංශ ක්‍රියාත්මක වන ආකාරය සහ අදාළ වාර්ෂික ඉලක්ක කරා යොමු වීම අධීක්ෂණය ද මෙම අංශය විසින් සිදු කරනු ලබයි. එහිදී, දෙපාර්තමේන්තුවේ අංශ හා දිස්ත්‍රික් කාර්යාලවල කාර්යයන් අධීක්ෂණය හා එමගින් ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කර කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා අදාළ කාර්යාලයන්හි ප්‍රගතිය තව දුරටත් වර්ධනය කර ගැනීම පිණිස අවශ්‍ය නිර්දේශ ලබා දීම මෙම අංශයේ අධීක්ෂණ කාර්යය වශයෙන් ඉටු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වන පුහුණුව ලබා දීම, බාහිර ආයතන විසින් පවත්වන පුහුණු පාඨමාලා වෙත නිලධාරීන් යොමු කිරීම, විශ්වවිද්‍යාල උපාධි හා පශ්චාත් උපාධි සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කාර්යය ඉටු කිරීම මෙම අංශය විසින් සිදු කරනු ලබන මානව සම්පත් සංවර්ධනය පිළිබඳ කාර්යභාරය වේ.

එසේම, දෙපාර්තමේන්තුවේ නිලධරයන් සඳහා අවශ්‍ය කම්කරු නීති සම්බන්ධ අණ පනත් සහ පඩි පාලක සභා තීරණ මුද්‍රණය කර ලබා දීම, කම්කරු නිලධාරීන්ට ක්ෂේත්‍ර කටයුතු සඳහා උපයෝගී කර ගැනීම පිණිස අවශ්‍ය වන ශ්‍රමික පරීක්ෂණ වාර්තා, මාසික දින පොත් ආදී පොදු ආකෘති පත්‍ර මුද්‍රණය කර ලබා දීම ආදී මුද්‍රණ කටයුතු ද මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

### 1.4.3.13 සංඛ්‍යාලේඛන අංශය

ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ දිශානතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පවතින කම්කරු නීති සහ අණපනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම හා ක්ෂේත්‍රය පිළිබඳව අනාගත පුරෝකථනය සඳහා කම්කරු ක්ෂේත්‍රයට අදාළව දත්ත එක් රැස් කර විශ්ලේෂණය කිරීම සංඛ්‍යාලේඛන අංශයේ කාර්යභාරය වේ.

ඒ අනුව, මෙම අංශය විසින් කම්කරු සංඛ්‍යාති වාර්ෂික වාර්තාව (Labour Statistics Sri Lanka), වැඩකළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබද සමීක්ෂණය (Survey on Working Hours and Labour Cost), පෞද්ගලික අංශයේ ශ්‍රම ඉල්ලුම පිළිබද සමීක්ෂණය (Outlook on Labour Needs of Private Sector), පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය (Annual Survey of Private and Semi Government Sector Employment), ශ්‍රම වෙළෙඳ පොල ප්‍රධාන දර්ශකාංක (Key Indicator of Labour Market) ආදී වාර්තා වාර්ෂිකව හෝ අවශ්‍යතාවය මත සකස් කර ප්‍රකාශයට පත් කරනු ලබයි.

### 1.4.3.14 අභ්‍යන්තර විගණන අංශය

අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන මෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව විසින් ද ක්‍රියාකාරකම්; මුදල් රෙගුලාසි, රජය විසින් කලින් කලට නිකුත් කරන චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තු චක්‍රලේඛ ආදී නීති රීති ප්‍රකාරව විධිමත් පරිදි සිදු කළ යුතු වේ. එසේ කටයුතු කිරීමේ දී, සම්පත්වල ඉහල උපයෝගිතාවයක් සහිත ව මනා විනිවිදභාවයකින් සහ ප්‍රශස්ත මට්ටමින් සිදුවේද යන්න අධීක්ෂණය සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ඍජු අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා ඇත.

## 1.5 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇති අතර එම අරමුදලෙහි කළමනාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් සිදු කරනු ලබයි.

# දෙවන පරිච්ඡේදය

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම


## 2.1 සේවකයන්ගේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන සේවකයන්ගේ සමාජ ආරක්ෂණය සඳහා 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරනු ලැබේ. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

### 2.1.1 සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීමට අදාලව තීරණ ලිපි 166,060 ක් යොමු කර ඇති අතර ඒ සම්බන්ධ තොරතුරු පහත ප්‍රස්තාරය මගින් නිරූපණය කර ඇත.

**ප්‍රස්ථාරය 2.1 - 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි යැවූ සංඛ්‍යාව**



### 2.1.2 දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් දායක මුදල් අයකර ගැනීමට අදාලව නිවේදන යැවීම

දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් එම මුදල් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම නිවේදන හා අවසන් නිවේදන යොමු අතර, ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ.

| රූප සටහන 2.1 – 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා නිවේදන යැවීමේ ප්‍රගතිය | | | |
|---|---|---|---|
| යැවූ පළමු නිවේදන සංඛ්‍යාව | පළමු නිවේදන වලට අදාළව ගණනය කරනු ලැබූ මුදල රු. | යැවූ අවසන් නිවේදන සංඛ්‍යාව | අවසන් නිවේදන වලට අදාළව ගණනය කරනු ලැබූ මුදල රු. |
| **14,412**   | **මිලියන 7,247**   | **7,040**   | **මිලියන 3,914**   |

### 2.1.3 සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධනය සඳහා සහ සේවාලාභීන් වෙත සේවා ලබා දීමේ කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග

- ✓ සේවාලාභීන් වෙත එකම ස්ථානයක් තුළින් සේවක අර්ථසාධක අරමුදල් ආශ්‍රිත සේවාවන් ඉටුකර ගැනීම සඳහා කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි පළමු මහලේ නව කාර්යාල පරිශ්‍රය 2024.08.06 දින විවෘත කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, පූර්ණ ප්‍රතිලාභ ගෙවීම් අංශය, මියගිය සාමාජිකයන්ගේ ප්‍රතිලාභ ගෙවීම් අංශය (L අංශය), 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් අංශය, මධ්‍යම ලිපිගොනු අංශය යන අංශ මෙම පළමු මහලේ ස්ථාපිත කර සේවාවන් සැපයීමට කටයුතු කරනු ලබයි. එසේම, උතුරු කොළඹ, දකුණු කොළඹ, නැගෙනහිර කොළඹ, බටහිර කොළඹ සහ මැද කොළඹ යන දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්ට අදාළව සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වශයෙන් ලියාපදිංචි කර ගැනීමේ නව ක්‍රමවේදය ද මෙම ස්ථානයේ දීම සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

- ✓ සාමාජිකයන් වෙත සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් නිවැරදි දැනුවත්භාවයක් නොමැතිවීම හේතුවෙන් උද්ගතවන ගැටළු අවම කිරීම සඳහා සහ සාමාජිකයන් මෙන්ම සේවායෝජකයන්ද දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේද සහයෝගය සහිතව ජංගම සේවා වැඩසටහන් 2024 වර්ෂය තුළදී ද පවත්වන ලදී.

- ✓ සේවකයන් සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි කිරීම සඳහා නව මෘදුකාංගයක් සකස් කිරීමේ කටයුතු 2023 වර්ෂයේදී සිදු කරන ලද අතර, එහි ඉදිරි ක්‍රියාකාරකම් 2024 වර්ෂයේදී ද ඉටු කරන ලදී. ඒ අනුව, මෙම නව මෘදුකාංගය සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි ස්ථාපනය කිරීමේ කටයුතු 2024 දෙසැම්බර් මාසය වන විට අවසන් කරන ලදී. මෙමගින් සේවකයන් සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

- ✓ සේවායෝජක ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම සහ ආයතන ලේඛනය ක්‍රමවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනා ගන්නා ලදී. ඒ අනුව, කම්කරු කාර්යාල විසින් මාසයකට අවම වශයෙන් සමූහ පරීක්ෂණ 04ක් සිදු කිරීම ආරම්භ කරන ලදී. එසේම, සමාජ මාධ්‍ය ඇතුළු ජන සන්නිවේදන මාධ්‍ය භාවිතය මගින් මහජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය ආදී වෙනත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල දත්ත පද්ධතිවල පවතින ආයතන පිළිබඳ තොරතුරු ද උපයෝගී කර ගනිමින් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම ප්‍රවර්ධනය කිරීම ආදී හඳුනා ගන්නා ලද අනෙකුත් ක්‍රියාකාරකම් 2025 වර්ෂයේ සිට සිදු කිරීමට සැලසුම් කර ඇත.

- ✓ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් ක්‍රමවේදය සරළ කිරීම සඳහා ප්‍රතිලාභ ඉල්ලුම් පත්‍රයන්හි සිදු කළ යුතු සංශෝධන, දත්ත පද්ධතිවලට දත්ත ඇතුළත් කිරීම සම්බන්ධයෙන් සිදු කළ යුතු සංශෝධන ආදිය හඳුනා ගෙන අදාළ පියවර ගැනීම ආරම්භ කරන ලදී.

## 2.2 ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

සේවායෝජකයන් විසින් සේවකයන් සේවයේ නියුක්ත කරවීමේ නීති නිසි පරිදි අනුගමනය කරනු ලබන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා 2024.01.01 සිට 2024.12.31 දක්වා සිදු කරන ලැබූ පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**රූප සටහන 2.2 - පරීක්ෂණ සිදු කිරීම - 2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය**

දිස්ත්‍රික් සහ උප කම්කරු කාර්යාලයන්හි කම්කරු නිලධාරීන් විසින් සිදු කල ශ්‍රමික පරීක්ෂණ සංඛ්‍යාව = 92,266

කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ පරීක්ෂණ සංඛ්‍යාව = 55

**එකතුව = 95,757**

ළමුන් සේවයේ යෙදවීමට අදාළව ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ පරීක්ෂණ සංඛ්‍යාව = 101

ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිතව අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ සංඛ්‍යාව = 47

වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්බන්ධ පරීක්ෂණ සංඛ්‍යාව = 3,288

එසේම, ශ්‍රමික පරීක්ෂණ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා කම්කරු නිලධාරීන් විසින් භාවිතා කරනු ලබන ශ්‍රමික පරීක්ෂණ වාර්තාව වඩාත් තොරතුරු ලැබෙන පරිදි සංශෝධනය කර 2024 නොවැම්බර් මාසයේ සිට භාවිතා කිරීම ආරම්භ කරන ලදී.

කම්කරු කාර්යාල බල ප්‍රදේශයන්හි (විශේෂයෙන් නගර සීමාවන්හි) පිහිටි ආයතන පරීක්ෂා කිරීම වඩාත් විධිමත්ව සහ කාර්යක්ෂමව සිදු කිරීම සඳහා දිස්ත්‍රික් කම්කරු කාර්යාලයක් මාසිකව සමූහ පරීක්ෂණ 04ක්ද උප කම්කරු කාර්යාල මාසිකව සමූහ පරීක්ෂණ 02ක්ද සිදු කිරීමේ ක්‍රමවේදයක් ද ආරම්භ කරන ලදී.


ශ්‍රමික පරීක්ෂණ ක්‍රමවේදය වර්තමාන සමාජ ආර්ථික පරිසරයන්ට ගැලපෙන පරිදි විධිමත් කිරීමට අදාළව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා එම සංවිධානයේ නියෝජිතයන් සමග මූලික සාකච්ඡාවක් පවත්වන ලදී. ඒ අනුව, වඩාත් විධිමත් ශ්‍රමික පරීක්ෂණ ක්‍රමවේදයක් (Comprehensive Framework for Labour Inspections) 2025 වර්ෂයේදී සකස් කිරීමට අපේක්ෂා කෙරේ.

## 2.3 කාර්මික සම්බන්ධතාවය


### 2.3.1 ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරාවුල් නිරවුල් කිරීම

කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වෙත සහ ප්‍රධාන කාර්යාලය වෙත සේවකයන් හෝ වෘත්තීය සමිති විසින් සිදු කරනු ලැබූ ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව සහ කාර්මික ආරාවුල් සම්බන්ධයෙන් ලැබූ පැමිණිලි විසඳීමට කටයුතු කරන ලදී. එසේම, සිදු කරනු ලැබූ පැමිණිලි විමර්ශනයක් හෝ ආයතන පරීක්ෂණයක් සම්බන්ධයෙන් සෑහීමට පත් නොවන අයකු විසින් නැවත පරීක්ෂණයක් සිදු කරවා ගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත සිදු කරනු ලබන ඉල්ලීම්, අවශ්‍යතාවය පරිදි වැඩිදුරටත් විමර්ශනය සඳහා යොමු කිරීම් ද සිදු කරන ලදී.

**ප්‍රස්තාරය 2.2 - 2019 වර්ෂයේ සිට 2024.12.31 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම්**




**ප්‍රස්තාරය 2.3 - 2019 වර්ෂයේ සිට 2024.12.31 දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම්**



කම්කරු දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන පෞද්ගලික හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයෙකුට සිය රැකියාව සම්බන්ධ ඕනෑම ආකාරයේ ගැටළුවක් පිළිබඳව https://cms.labourdept.gov.lk යන ඊ සේවාව මගින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත මාර්ගගත ක්‍රමය ඔස්සේ පැමිණිලි ඉදිරිපත් කිරීමට පහසුකම් 2022 වර්ෂයේ මාර්තු මාසයේ සිට සලසා දෙන ලදී. ඒ අනුව මෙම පැමිණිලි කළමනාරණ පද්ධතිය (Complaint Management System – CMS) වෙත වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය මොඩියුලය (OSH Module) සහ නීති මොඩියුලය (Legal Module) ඇතුලත් කර අදාළ මෘදුකාංග සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

එසේම, කම්කරු දෙපාර්තමේන්තුවට ලැබෙන පැමිණිලි සහ පෙත්සම් විසඳීමේ කටයුතු සම්මත පරිපාටියකට අනුව සිදු කිරීම තුළින් එම කටයුතු වඩාත් කාර්යක්ෂමව සහ ගුණාත්මකව සිදු කළ හැකි වේ. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවට ලැබෙන පැමිණිලි සහ පෙත්සම් විසඳීමේ මාර්ගෝපදේශයක් වශයෙන් පැමිණිලි සහ පෙත්සම් විසඳීමේ සම්මත කාර්යය පටිපාටි සහ ඊට අදාළ උපදෙස් මාලාවක් සකස් කරන ලද අතර, එම පටිපාටි 2021 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට අදාළ කාර්යාල සහ අංශ විසින් භාවිතා කරනු ලැබේ. මෙම කටයුතු තවදුරටත් කාර්යක්ෂම කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ලබා ගනිමින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පැමිණිලි සහ පෙත්සම් නිරවුල් කිරීම සම්බන්ධයෙන් විධිමත් මාර්ගෝපදේශයක් (Comprehensive Guide for Handling of Inquiries on Labour related Complaints) සකස් කිරීමේ කටයුතු 2025 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

### 2.3.2 බේරුම්කරණ කටයුතු සිදු කිරීම

ප්‍රාදේශීය කාර්යාල මගින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මගින් කටයුතු කළ ද නිරවුල් කළ නොහැකි වූ කාර්මික ආරාවුල්, බේරුම්කරණය හෝ කාර්මික අධිකරණයක් වෙත යොමු කිරීම සිදු කරනු ලැබේ. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාල සීමාව තුළදී බේරුම්කරණය සඳහා යොමු කරනු ලැබූ ආරාවුල් 81 ද ඇතුලත්ව ආරාවුල් 219 ක් සම්බන්ධයෙන් 2024 වර්ෂය තුළදී කටයුතු කිරීමට නියමිතව තිබුණි. ඒ අතුරින් ආරාවුල් 111 ක පරීක්ෂණ කටයුතු 2024 වර්ෂය තුළදී අවසන් කර ප්‍රදාන 70 ක් ලබා දී ඇති අතර ප්‍රදාන 41 ක් ඉදිරියේදී ලබා දීමට ඇත. ඒ අනුව, 2024.12.31 දින වන විට ආරාවුල් 108 ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පැවතිණි.

### 2.3.3 සාමූහික ගිවිසුම් සඳහා සේව්‍ය හා සේවක දෙපාර්ශවය පෙළඹවීම

සාමූහික ගිවිසුම්වලට එළඹීම මගින් සේවකයන් වෙත කම්කරු නීති මගින් හිමිකර දී ඇති අයිතිවාසිකම්වලට වඩා වැඩි වරප්‍රසාද හිමි වනවා මෙන්ම සේවායෝජක පාර්ශවයන්ට සේවකයන් වෙතින් වඩා ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා අදාල කොන්දේසි වෙත එළඹීමටද හැකියාව ලැබේ.

සමාජ කතිකාව මගින් සේවා හා සේවක පාර්ශවයන් එවැනි ආකාරයේ සාමූහික ගිවිසුම් වෙත එළඹීම ප්‍රවර්ධනය කරනු ලබයි. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාල සීමාව තුළදී කාලය දීර්ඝ කරනු ලැබූ සාමූහික ගිවිසුම් 14 ද ඇතුළුව 2024.12.31 දිනට ක්‍රියාත්මකව පවතින සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 225 කි.

### 2.3.4 වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම

සෑම වෘත්තීය සමිතියක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කිරීම වෘත්තීය සමිති ආඥා පනත යටතේ අනිවාර්ය අවශ්‍යතාවයක් වේ. ඒ අනුව, 2024.01.01 සිට 2024.12.31 දක්වා දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරනු ලැබූ වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 123 කි. 2024 වර්ෂය තුළදී වෘත්තීය සමිති 100 ක් අවලංගු කර ඇත. ඒ අනුව, 2024.12.31 දිනට වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 2141 කි.

### 2.3.5 වැඩ වර්ජන විසඳීම සඳහා අදාළ මැදිහත්වීම් සිදු කිරීම

කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම දෙපාර්තමේන්තුව විසින් එම තත්ත්වය වැළැක්වීම සඳහා මැදිහත් වීම සිදු කරනු ලබන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් එම වැඩවර්ජනයට අදාළ ආරාවුල නිරවුල් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. 2024.01.01 සිට 2024.12.31 දක්වා වාර්තා වූ වැඩ වර්ජන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| වගුව 2.1 - වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2024.01.01 සිට 2024.12.31 දක්වා | | | |
|---|---|---|---|
| **ක්ෂේත්‍රය** | **වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව** | **සහභාගී වූ සේවක සංඛ්‍යාව** | **අහිමි වූ මිනිස්දින සංඛ්‍යාව** |
| වතු | 04 | 1199 | 5879 |
| ඉදිකිරීම් | - | - | - |
| නිෂ්පාදන | 08 | 6675 | 35,170 |
| පතල් හා කැණීම් | - | - | - |
| නවාතැන් හා ආහාර සැපයුම් | - | - | - |
| අර්ධ රාජ්‍ය | 01 | 260 | 5720 |
| වෙනත් සේවා | - | - | - |
| **එකතුව** | **13** | **8134** | **46,769** |

### 2.3.6 සේවා සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම

පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේවා සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා එම අංශවල ආයතනයන්හි සේවා සේවක දෙපාර්ශවයම සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගිතාවය සහ කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කොට පවත්වන ලදී.

ඒ අනුව, 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධන අංශය විසින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු පහත පරිදි වේ.

| වැඩසටහනෙහි ස්වභාවය | වැඩසටහනෙහි නම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| **සමාජ කතිකාව ප්‍රවර්ධනය** | සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන් | 155 | 9,544 |
| | සමාජ වේදිකා වැඩසටහන් | 24 | 2,140 |

ඉහත දැනුවත් කිරීමේ වැඩසටහන්වලට අතිරේකව ආයතනික මට්ටමින් සමාජ කතිකාව සහ වැඩපොළ සහයෝගිතාව ප්‍රචලිත කිරීමේ අරමුණ පෙරදැරිව කාර්මික සංහිඳියාව සඳහා වන විශිෂ්ටතා සහතික අදාළ ආයතන වෙත ප්‍රදානය කිරීමේ කටයුතු 2023 සහ 2024 වර්ෂයන්හිදී සිදු කරන ලද අතර 'කාර්මික සංහිඳියාව සඳහා වන විශිෂ්ටතා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය' 2024.11.06 දින කම්කරු මහ ලේකම් කාර්යාලයීය 10 වන මහල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.




**ඡායාරූපය 2.1 - කාර්මික සංහිඳියාව සඳහා වන විශිෂ්ටතා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයේ ඡායාරූපයක් - 2024.11.06**

සේවායෝජකයන් විසින් කම්කරු නීති කෙරෙහි ස්වයං අනුකූලතාවය තුළින් තිරසාර සේවා සේවක සම්බන්ධතාවයක් ඇති වන අතර, එමගින් සේවායෝජකයන්ට ආර්ථික ප්‍රතිලාභ රාශියක් ද හිමි වේ. එබැවින් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සෑම අවස්ථාවකදීම සේවායෝජකයන් කම්කරු නීති කෙරෙහි ස්වයං අනුකූලතාවය දැක්වීම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, කම්කරු නීති කෙරෙහි සේවායෝජකයන් ස්වයං අනුකූලතාවය දැක්වීමට (Self Compliance to Labour laws) අදාළ වැඩපිළිවෙලක් සකස් කිරීමට ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලද අතර එහි ඉදිරි ක්‍රියාකාරකම් 2025 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

## 2.4 සේවකයන් සේවයේ යෙදවීමට අදාළ අයිතීන් ආරක්ෂා කර දීම සඳහා නෛතික රැකවරණය

සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, එම නීති උල්ලංඝනය කරන සේවායෝජකයන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත්, ඒ තුළින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ අධිකරණ ක්‍රියාමාර්ගවලට අදාළ ප්‍රගතිය පහත වගුව පරිදි වේ.

**ප්‍රස්ථාරය 2.4 - මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා**




සටහන - ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන් විසින් ගනු ලැබූ අධිකරණ ක්‍රියා මාර්ග පිළිබඳ තොරතුරු ඉහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

| අධිකරණය | 2023.12.31 දිනට පැවති නඩු සංඛ්‍යාව | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා එක් වූ නඩු සංඛ්‍යාව | 2024.12.31 දිනට අවසන් වූ නඩු සංඛ්‍යාව | 2024.12.31 දිනට ඉතිරි නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 133 | 19 | 9 | 143 |
| අභියාචනාධිකරණය | 425 | 66 | 51 | 440 |
| මහාධිකරණය | 107 | 23 | 26 | 104 |
| වාණිජ මහාධිකරණය | 224 | 11 | 9 | 226 |

සටහන - නීති ක්‍රියා අංශය සෘජු මැදිහත්වීම මත සිදු කරනු ලැබූ අධිකරණ ක්‍රියා මාර්ග (මහේස්ත්‍රාත් අධිකරණ හැර) පිළිබඳ තොරතුරු ඉහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

කම්කරු ක්ෂේත්‍රයට අදාළ පනත් සංශෝධනය කිරීම සහ නව පනත් හඳුන්වා දීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

| පනතේ නම | සංශෝධන සිදු කිරීමේ අරමුණ |
|---|---|
| 2024 අංක 28 දරන සාප්පු හා කාර්යාල (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත | තොරතුරු තාක්ෂණය මත පදනම්වූ ව්‍යාපාර ක්‍රියාවලි සහ දැනුම් ක්‍රියාවලි බාහිරකරණය කරනු ලැබූ ආයතනවල සේවයේ නියුතු සේවිකාවන් රාත්‍රී කාලයේ සේවයේ යෙදවීමට විධිවිධාන සැලසෙන පරිදි 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම |
| 2024 අංක 48 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත | 2024.09.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවකයකයන්ගේ අවම මාසික වේතනය රු. 12,500.00 සිට රු. 17,500.00 දක්වා ද අවම දෛනික වේතනය රු. 500.00 සිට රු.700.00 දක්වා ද වැඩි කිරීම. |

## 2.5 ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ වැටුප් හා සේවා කොන්දේසි යාවත්කාලීන කිරීම සහ එම අයිතීන් ආරක්ෂා කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. ඒ අනුව, 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා එම විෂය ක්ෂේත්‍රයට අදාලව පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

### 2.5.1 පඩිපාලක සභාවල අවම වැටුප් යාවත්කාලීන කිරීම

| පඩිපාලක සභාව | අවම වැටුප් යාවත්කාලීන කිරීම සඳහා ගන්නා ලද පියවර |
|---|---|
| 1.තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය | කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය රු. 1,350.00 ක් ලෙස ද සම්මත ප්‍රමාණයට වඩා වැඩියෙන් නෙළනු ලබන සෑම තේ දළු කිලෝග්‍රෑම් 01ක් සඳහාම (Over Kilo Rate) රු. 50.00 ක් ලෙස දෛනික ගෙවීමද සංශෝධනය කරන ලදී. (මෙම තීරණය 2024.09.10 දින සිට ක්‍රියාත්මක වේ.) |

| | |
|---|---|
| 2.රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය | කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය රු. 1,350.00 ක් ලෙස ද සම්මත ප්‍රමාණයට වඩා වැඩියෙන් ගෙනෙන සෑම රබර් කිරි කිලෝග්‍රෑම් 01ක් සඳහාම (Over Kilo Rate) රු. 50.00 ක් ලෙස දෛනික ගෙවීමද සංශෝධනය කරන ලදී. (මෙම තීරණය 2024.09.10 දින සිට ක්‍රියාත්මක වේ.) |

**2.5.2 දින 05 වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම**

| 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | | 2024.12.31 දිනට අනුමැතිය ලබා දීම සඳහා ඉදිරි කටයුතු කරමින් පැවති සංඛ්‍යාව |
|---|---|---|---|
| ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | අනුමැතිය ලබා දීම් සංඛ්‍යාව | ප්‍රතික්ෂේප කිරීම් සංඛ්‍යාව | |
| **339** | **320** | **(08)** | **11** |

**2.5.3 සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම**

| 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | | 2024.12.31 දිනට පරීක්ෂා කරමින් පැවති සංඛ්‍යාව |
|---|---|---|---|
| ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | අනුමැතිය ලබා දීම් සංඛ්‍යාව | ප්‍රතික්ෂේප කිරීම් සංඛ්‍යාව | |
| **39** | **21** | **-** | **18** |

**2.5.4 පඩි පාලක සභා අණ්ඩපනත හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම**

| 2024.01.01 දිනට ශේෂය | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | අනුමැතිය ලබා දීම් සංඛ්‍යාව | ප්‍රතික්ෂේප කිරීම් සංඛ්‍යාව | |
| **119** | **262** | **124** | **(128)** | **129** (අසම්පූර්ණ ලේඛන ඉදිරිපත් කරන ලද මෙම ආයතන 129 වෙත අදාළ ලේඛන ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත) |

**2.5.5 අණ පනත් සම්බන්ධයෙන් සේවා හා සේවක පාර්ශව විසින් සිදු කරනු ලබන විමසීම් සඳහා පැහැදිලි කිරීම් හා අර්ථ නිරූපණ ලබා දීම**

| 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | 2024.12.31 දිනට පිළිතුරු සකස් කරමින් පැවති ශේෂය |
|---|---|---|
| ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | පිළිතුරු ලබා දුන් සංඛ්‍යාව | |
| 70 | 69 | 01 |

## 2.6 සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම

කාන්තාවන් සේවයේ නියුක්ත කරවීමේදී ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා වන පරිදි කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ ලබාදීම මගින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම මෙන්ම ශ්‍රී ලංකාව තුළින් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා කටයුතු කිරීම කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**2.6.1 ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි වලට අදාලව පරීක්ෂණ සිදු කිරීම**

| 2024.01.01 දිනට ශේෂය | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳනු ලැබූ පැමිණිලි සංඛ්‍යාව | |
| 13 | 100 | 101<br>(මේ අතරින් ළමා ශ්‍රමයක් ඇති බවට අනාවරණය වූ පැමිණිලි සංඛ්‍යාව 02ක් වන අතර ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.) | 12 |

**2.6.2 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ**

| 2024.01.01 දිනට ශේෂය | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳනු ලැබූ පැමිණිලි සංඛ්‍යාව | |
| 02 | 07 | 09 | - |

### 2.6.3 කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම



- අනුමැතිය ලබා දීම්

751

### 2.6.4 ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සිදු කරනු ලැබූ වැඩසටහන් පිළිබඳ තොරතුරු

**(අ) ළමා ශ්‍රමය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම පිණිස ප්‍රජා පොලිස් කමිටු සමග ඒකාබද්ධව කටයුතු කිරීම**

ළමා ශ්‍රමය තුරන් කිරීම හා පුරවැසි වගකීම පිළිබඳ පණිවුඩය බිම් මට්ටම දක්වා රැගෙන යාමේ කටයුතු ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රජා පොලිස් කමිටු හරහා සිදු කිරීම වඩාත් ප්‍රායෝගික බවට හඳුනා ගන්නා ලදී. ඒ අනුව, 2024 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි සහ 2025 වර්ෂයේ දී මුළු දිවයිනම ආවරණය වන පරිදි මෙම ජාතික වගකීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට තීරණය කරන ලදී.

මෙහි මූලික අදියර වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රජා පොලිස් කොට්ඨාශ භාර ස්ථානාධිපතිවරුන්, ඒ යටතේ ක්‍රියාත්මක වන ප්‍රජා පොලිස් ඒකකයන්හි ස්ථානාධිපතිවරුන්, කම්කරු දෙපාර්තමේන්තුවේ අදාල නියෝජ්‍ය හා සහකාර කම්කරු කොමසාරිස්වරුන් වෙනුවෙන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ සැසියක් පවත්වා ඔවුන් දැනුවත් කර, එමගින් ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රජා පොලිස් කමිටු සමග සම්බන්ධ වී සියළුම ආකාරයේ ළමා ශ්‍රමය ශ්‍රී ලංකාවෙන් සම්පූර්ණයෙන්ම තුරන් කිරීමේ පණිවුඩය බිම් මට්ටම දක්වා රැගෙන යාමේ කටයුතු 2024 වර්ෂයේ තෙවන කාර්තුව තුළදී ආරම්භ කරන ලදී.

**ඡායාරූපය 2.2 - අවිස්සාවේල්ල ප්‍රජා පොලිස් කොට්ඨාශය මගින් සංවිධානය කරන ලද වැඩසටහනෙහි ඡායාරූපයක් - 2024.12.27**



එහි දෙවන අදියර වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ එක් එක් පොලිස් ස්ථානයට අදාල ප්‍රජා පොලිස් උපදේශන කමිටු 52 ක් සමග කම්කරු දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් සම්බන්ධවී පොලිස්

ස්ථාන මට්ටමින් සියලුම උපදේශන කමිටු සාමාජිකයින් දැනුවත් සඳහා වැඩසටහන් සැලසුම් කර සිදු කරන ලදී. මෙම වැඩසටහන් වල ප්‍රගතිය 2024.12.10 දින ප්‍රගති සමාලෝචන රැස්වීමක් මගින් සමාලෝචනය කිරීමටද කටයුතු කරන ලදී.





එහි තෙවන අදියර වශයෙන් 2025 වර්ෂයේදී මුළු දිවයිනම ආවරණය වන පරිදි මෙම වගකීම ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කිරීම සඳහා විශේෂ වැඩසටහනක් 2024.12.18 දින පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රජා පොලිස් දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ප්‍රජා පොලිස් හා පාරිසරික දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති, දිවයිනේ සියලුම පොලිස් කොට්ඨාසවල ප්‍රජා පොලිස් කමිටු භාර සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන් සහ කම්කරු දෙපාර්තමේන්තුවේ සියළුම කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්, දිස්ත්‍රික් සහකාර කම්කරු කොමසාරිස්වරුන් සහ ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන් සහභාගී විය.

**(ආ) ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීම**

සෑම වර්ෂයකම ජුනි 12 දිනට යෙදෙන 'ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට' සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2024.06.18 දින සැමරුම් වැඩසටහනක් පවත්වන ලදී. එහිදී, විධිමත් ක්ෂේත්‍රයන්හි ආයතනවල, විශේෂයෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කාර්මික උද්‍යාන වල ස්ථාපිත ආයතනවල සේවායෝජකයන් වෙතින්, සිය ආයතන විසින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. එයට සමගාමීව දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය මගින් QR කේතයක් හඳුන්වා දී ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට දිවයිනේ සියලුම ආයතන වෙතින් ප්‍රතිඥාව ලබා ගැනීමේ කටයුතු ද ආරම්භ කරන ලදී.

එසේම, ක්ෂේත්‍ර පරීක්ෂණවල යෙදෙන කම්කරු නිලධාරීන් විසින් අවිධිමත් ක්ෂේත්‍රය ප්‍රමුඛ කර ගනිමින් අනෙකුත් සියලුම ක්ෂේත්‍රයන්හි සේවායෝජකයන් වෙතින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීමේ කටයුතු ද ආරම්භ කරන ලදී.

### 2.6.5 දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේවා සේවක දෙපාර්ශවය කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් මෙන්ම රාජකාරි කටයුතු සිදු කිරීමේදී කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති පිළිබඳව දැනුවත්භාවක් ලැබිය යුතු අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්ද දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කොට පවත්වන ලදී. ඒ අනුව, 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු පහත පරිදි වේ.

| වගුව **2.2 - 2024.01.01** දින සිට **2024.12.31** දින දක්වා කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් | | | |
|---|---|---|---|
| **වැඩසටහන්වල ස්වභාවය** | **වැඩසටහනෙහි නම** | **පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව** | **සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව** |
| **ස්ත්‍රීන් සහ තරුණ අයගේ සේවයේ නියුක්ත කරවීමේ අයිවාසිකම් ආරක්ෂා කිරීම සහ ළමා ශ්‍රමය පිටු දැකීම** | පෞද්ගලික අංශයේ සේවිකාවන් සඳහා කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් | 12 | 418 |
| | අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණවලට සමගාමීව ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිත ප්‍රජාව තුළ අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ නීතිය සම්බන්ධ දැනුවත් කිරීම් | 47 | 2176 |
| | තේ සහ වැවිලි බෝග ක්ෂේත්‍රය සහ කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත කුඩා හා මධ්‍ය පරිමාණ සේවායෝජකයින් සඳහා අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ නීතිය සම්බන්ධ දැනුවත් කිරීම් | 62 | 1532 |
| | කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රජා පොලිස් කොට්ඨාස භාර ස්ථානාධිපතිවරුන්, ඒ යටතේ ක්‍රියාත්මක වන ප්‍රජා පොලිස් ඒකකයන්හි ස්ථානාධිපතිවරුන්, කම්කරු දෙපාර්තමේන්තුවේ අදාළ නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් සහ සහකාර කම්කරු කොමසාරිස්වරුන් සඳහා ළමා ශ්‍රමය තුරන් කිරීම හා පුරවැසි වගකීම පිළිබඳ පණිවුඩය බිම් මට්ටම දක්වා රැගෙන යාම සම්බන්ධ විශේෂ පුහුණු වැඩසටහන | 01 | 142 |
| | ප්‍රජා පොලිස් උපදේශන කමිටු සමග ඒකාබද්ධ වී කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ වී උපදේශන කමිටු සාමාජිකයින් වෙත අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ නීතිය සම්බන්ධ දැනුවත් කිරීම් | 14 | 587 |

## 2.7 සේවකයාගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා වූ සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම

කර්මාන්තශාලා තුළ සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම සහ අනතුරු ඇති වීම අවම කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලාවල සේවය කරන සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනය සම්බන්ධයෙන් 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත යටතේ කටයුතු කරනු ලැබේ.

අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ප්‍රධාන වශයෙන් පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

| | |
|---|---|
|  | **කර්මාන්තශාලා ආඥා පනතේ නව රෙගුලාසි යටතේ 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කර්මාන්තශාලා 2221 ක් ලියාපදිංචි කරන ලදී. ඒ අනුව, කර්මාන්තශාලා ආඥා පනතේ නව රෙගුලාසි යටතේ 2024.12.31 දිනට ලියාපදිංචි කරනු ලැබූ කර්මාන්තශාලා සංඛ්‍යාව 6614 කි.** |
| **2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පරීක්ෂා කර අනුමත කරන ලද ගොඩනැගිලි පිඹුරුපත් සංඛ්‍යාව 244 කි.** |  |
|  | **දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කර්මාන්තශාලා 2578 ක් පරීක්ෂා කර ඇත.** |
| **2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වාර්තා වී විමර්ශනය කරන ලද මරණීය අනතුරු සංඛ්‍යාව 47 ක් වන අතර මරණීය නොවන අනතුරු සංඛ්‍යාව 1606 කි.** |  |
|  | **බලයලත් නිලධාරීන් විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පරීක්ෂා කර ඉදිරිපත් කරනු ලැබූ අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව 11,965 කි.** |

වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳව සේවා සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම තුළින් සේවා ස්ථාන ආශ්‍රිතව ඇති වන අනතුරු අවම කර ගැනීමටත් ආරක්ෂිත සේවා පරිසරයක් ඇති කිරීමටත් හැකියාව ලැබේ. ඒ අනුව, 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කර්මාන්තමය සුරක්ෂිතතා අංශය විසින් පවත්වන ලද සේවා සේවක දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2.3 - 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කර්මාන්තමය සුරක්ෂිතතා අංශය විසින් පවත්වන ලද සේවා සේවක දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු**

| වැඩසටහනේ ස්වභාවය | වැඩසටහනෙහි නම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| **වෘත්තීය සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය** | වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳව පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් (ඇඟළුම්, නිෂ්පාදන, වැවිලි, ඉදිකිරීම් ආදී ක්ෂේත්‍ර ආවරණය වන පරිදි) | 115 | 5,288 |

- **සේවක සුරක්ෂිතතාවය ඉහල නැංවීම සඳහා ද්වීපාර්ශවීය සුරක්ෂිතතා කමිටු පිහිටුවීම**

කර්මාන්තශාලා තුළ වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කිරීම මගින් සුරක්ෂිතතා සංස්කෘතියකට මග පෑදීම ද්වීපාර්ශවීය සුරක්ෂිතතා කමිටු පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වේ.

සියලුම කර්මාන්ත ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාල සීමාව තුළ දී ද්වීපාර්ශවීය සුරක්ෂිතතා කමිටු 202 ක් පිහිටුවා ඇත. ඒ අනුව, 2024.12.31 දිනට පිහිටුවා ඇති මුළු ද්වීපාර්ශවීය සුරක්ෂිතතා කමිටු සංඛ්‍යාව 877 කි.

- **වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් සේවායෝජකයන් සහ සේවකයන් පුහුණු කිරීමේදී භාවිතා කිරීම සඳහා පුහුණු මොඩියුල සකස් කිරීම**

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වෘත්තීය සුරක්ෂිතතාවය, විදුලි සුරක්ෂිතතාවය, යාන්ත්‍රික සුරක්ෂිතතාවය සහ රසායනික ද්‍රව්‍ය සුරක්ෂිතතාවය යන ක්ෂේත්‍රයන් 04 සම්බන්ධයෙන් සේවායෝජකයන් සහ සේවකයන් දැනුවත් කිරීමේදී භාවිතා කිරීම සඳහා වෙන් වශයෙන් පුහුණු මොඩියුල කෙටුම්පත් සකස් කරන ලදී. එහි ඉදිරි කටයුතු 2025 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

## 2.8 සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම්

සේවා ස්ථානයන්හි සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සේවා ස්ථානවල සෞඛ්‍ය ගැටලු හෝ අනතුරු සිදුවීමට හැකි අවස්ථා පවතීද යන්න සම්බන්ධයෙන් විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ සොයා බැලීම සහ එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වළක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබේ. ඒ අනුව 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

| රූප සටහන **2.3 – 2024.01.01** දින සිට **2024.12.31** දින දක්වා කාල සීමාව තුළ දී ඉටු කරන ලද ක්‍රියාකාරකම් | |
|---|---|
|  | පාරිසරික මිනුම් සංඛ්‍යාව = 233 |
| | ජෛව විද්‍යාත්මක පරීක්ෂණ සංඛ්‍යාව = 236 |
| | වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් සංඛ්‍යාව = 241 |

**වගුව 2.4 – 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාල සීමාව තුළ දී වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් විවිධ ආයතන තුළ ඇතිවූ ගැටළුකාරී තත්ත්වයන් විසඳීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග**

| මැදිහත් වීම් සිදු කර ගැටළුකාරී තත්ත්වයන් විසඳනු ලැබූ ආයතන සංඛ්‍යාව | ක්‍රියාකාරකමේ නිමැවුම |
|---|---|
| 08 | ප්‍රධාන වශයෙන් ආයතන 08ක ඇති වූ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයන් සඳහා අවශ්‍ය මැදිහත් වීම් සිදු කර එම තත්ත්වයන් විසඳීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී. එමගින් සේවකයන් 1,752 දෙනෙකුගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය අයිතීන් සම්බන්ධයෙන් වන ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට පියවර ගන්නා ලදී. |

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වෘත්තීය ස්වස්ථතා අංශය විසින් සිදු කරන ලද සේවා සේවක දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු පහත පරිදි වේ.

| වගුව **2.5 - 2024.01.01** දින සිට **2024.12.31** දින දක්වා වෘත්තීය ස්වස්ථතා අංශය විසින් සිදු කරන ලද සේවා සේවක දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු | | | |
|---|---|---|---|
| **වැඩසටහනේ ස්වභාවය** | **වැඩසටහනෙහි නම** | **පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව** | **සහභාගී වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව** |
| **වෘත්තීය සෞඛ්‍යය ප්‍රවර්ධනය** | සේවායෝජකයන් සහ සේවකයන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන් | 92 | 1,101 |
| | ස්ථානීය පරීක්ෂණ වලින් අනතුරුව සේවායෝජකයන් සහ සේවකයන් සඳහා පවත්වන ලද ක්ෂේත්‍රගත පුහුණු (On the spot field trainings) වැඩසටහන් | 173 | 2,832 |

එසේම, බස්නාහිර පළාත තුළ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල වැඩ පරිසර තත්ත්වය (ශබ්දය, ආලෝකය, තාපය, වාතාශ්‍රය ආදිය) ප්‍රමිතිගත තත්ත්වයට ගෙන ඒමේ ව්‍යාපෘතියක් 2024 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඒ අනුව, බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කයන්හි තෝරා ගන්නා ලද පහත සඳහන් කර්මාන්තපුරයන් හි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

- **කොළඹ දිස්ත්‍රික්කයේ** - කාර්මික සංවර්ධන මණ්ඩලයේ පානළුව කාර්මික ජනපදය සහ පනාගොඩ Templeburg කර්මාන්තපුරය
- **ගම්පහ දිස්ත්‍රික්කයේ** - කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඒකල කාර්මික ජනපදය
- **කළුතර දිස්ත්‍රික්කයේ** - නාගොඩ Fulerton කර්මාන්තපුරය, හොරණ වවුලගල කර්මාන්තපුරය සහ හොරණ අරමනාගොල්ල කර්මාන්තපුරය

මෙම ව්‍යාපෘතියේ මූලික සමීක්ෂණ කටයුතු වලදී කර්මාන්ත ශාලාවන් හි සිටින මුළු සේවක සංඛ්‍යාව, නිෂ්පාදනය, අමුද්‍රව්‍ය, වැඩ කරන වේලාවන්, සේවක සුබසාදන පහසුකම් සහ පාරිසරික තත්ත්වයන් (ආලෝක මට්ටම, ශබ්ද මට්ටම, තාප විදාව (Wet Bulb Globe Temperature – WBGT) ආදිය) පිළිබඳව තොරතුරු එක් රැස් කරන ලදී. එසේම, පාරිසරික තත්ත්වය පිළිබඳව ලබා ගන්නා ලද මිනුම් අනුව සම්මත මට්ටමින් අපගමනය වූ අවස්ථා හඳුනාගෙන වැඩ පාරිසරික තත්ත්වයන් දියුණු කර ගත යුතු ආකාරය සම්බන්ධයෙන් සේවායෝජකයන් සහ සේවකයින් දැනුවත් කිරීම සහ නිර්දේශ ලබා දීම සිදු කරන ලදී.

## 2.9 දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය




කම්කරු දෙපාර්තමේන්තුවේ නව නිල වෙබ් අඩවිය (www.labourdept.gov.lk) එළිදැක්වීම 2024.06.18 දින සිදු කරන ලදී. සේවාලාභීන් සඳහා අවශ්‍ය අයදුම් පත්‍ර, ආකෘති පත්‍ර, උපදෙස් හා කම්කරු අණ පනත් මෙන්ම සේවායෝජකයන් විසින් අනුගමනය කළ යුතු පඩි පාලක සභා තීරණ ඇතුළු අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි වන පරිදි මෙම වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර එම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම, දෙපාර්තමේන්තුවේ ඊ-සේවාවන් ලබා ගැනීමේ පහසුකම්ද මෙයට ඇතුළත් කර සංවර්ධනය කරමින් පවතී.

## 2.10 දෙපාර්තමේන්තුවේ නිල සමාජ මාධ්‍ය කටයුතු

දෙපාර්තමේන්තුව විසින් නිල යූ ටියුබ් චැනලයක්, ෆේස්බුක් පිටුවක් සහ ට්විටර් ගිණුමක් පවත්වාගෙන යමින් යාවත්කාලීන කරනු ලැබූ තොරතුරු මහජනතාව වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

| | |
|---|---|
| YouTube Channel | Subscribers: 1.87K<br>Number of Videos included : 130 |
| Facebook Page | Followers: 1.5K |
| Twitter | Followers: 105 |

## 2.11 කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය

කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත්, පොත්පත් හා ප්‍රකාශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම පුස්තකාලය කම්කරු දෙපාර්තමේන්තුවේ විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙමගින් කම්කරු දෙපාර්තමේන්තුවේ, කම්කරු අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා මෙන්ම බාහිර පාඨකයන් සඳහා ද කම්කරු නීති ක්ෂේත්‍රයට අදාළ සියලුම අණ පනත්, පොත් පත්, ප්‍රකාශන ආදිය පරිශීලනය සඳහා පහසුකම් සලසනු ලබයි.

පුස්තකාලයේ පහසුකම් තව දුරටත් සංවර්ධනය කිරීම සඳහා පුස්තකාල දත්ත කළමනාකරණ පද්ධතිය (KOHA මෘදුකාංගය) ස්ථාපිත කිරීමේ කටයුතු 2025 වර්ෂය තුළදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

## 2.12 තොරතුරු සන්නිවේදන කටයුතු

### 2.12.1 ප්‍රකාශන කටයුතු



கதிகாவ
Kathikawa

ISBN2012-9084 | 23වන වෙළුම | 2024 දෙසැම්බර්

කාර්මික සංහිඳියාව සඳහා වන සමාජ කතිකා විශිෂ්ටතා සහතිකය 2023 සහතික ප්‍රදානෝත්සවය

- **කතිකාව සඟරාව**

ආයතන තුළ සේවා හා සේවක දෙපාර්ශවය අතර සුහදතාවය වර්ධනය කිරිම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම මගින් ආරවුල් අවම කිරීම සඳහා දායකත්වය ලබා දීම කතිකාව සඟරාව එළි දැක්වීමේ අරමුණ වේ. ඒ අනුව, කතිකාව සඟරාවේ 23 වන වෙළුම 2024 දෙසැම්බර් මාසයේදී එළිදක්වන ලදී.


- කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යභාරය සහ කම්කරු නීති සම්බන්ධයෙන් මහජනතාව තුළ දැනුම වර්ධනය කිරිම සඳහා AI Chatbot සකස් කිරීම සහ කම්කරු නීති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නිලධාරින්ගේ දැනුම වර්ධනය කිරිම සඳහා Self Learning Module සකස් කිරිම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ තාක්ෂණික සහය ලබා ගනිමින් 2025 වර්ෂයේදී සිදු කිරීමට අපේක්ෂිතය.

### 2.12.2 කම්කරු ක්ෂේත්‍රයට අදාළ සමීක්ෂණ සහ අධ්‍යයනයන්

- **වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය**

මෙම සමීක්ෂණය මගින් රටේ සංවර්ධන ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය ශ්‍රම පිරිවැය, වැඩකළ පැය ගණන හා සාමාන්‍ය ඉපයීම් පිළිබඳ දත්ත ලබා ගැනීම සිදු කෙරේ. එමගින් රජයේ සහ පෞද්ගලික අංශයේ සැලසුම් සම්පාදනය හා තීරණ ගැනීම සඳහා මෙන්ම සේවා සේවක දෙපාර්ශවයේ උන්නතිය වෙනුවෙන් සකස් කරනු ලබන ඉදිරි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දීම සිදු කෙරේ.


වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණයේ 2023 වර්ෂයට අදාළ දත්ත පරිසනක ගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එසේම, 2024 වර්ෂයට අදාල තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි අදාළ ආයතන වෙත තැපැල් කිරීමේ කටයුතු ද සිදු කරන ලදී.




- **Annual Survey of Private and Semi-Government Sector Employment - 2022**

මෙම වාර්තාව මගින් පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන් සතියක් තුළදී සාමාන්‍යයෙන් වැඩකරන පැය ගණන, සාමාන්‍ය මාසික නාමික ආදායම, සාමාන්‍ය මාසික මූර්ත ආදායම, ශ්‍රම පිරිවැය ආදී තොරතුරු ස්ත්‍රී පුරුෂ භාවය අනුව හා රැකියාව අනුව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

- **ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024 - කොළඹ දිස්ත්‍රික්කය**




කොළඹ දිස්ත්‍රික්කයෙහි ළමා ශ්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය ඇගයීම, ළමා ශ්‍රමිකයන් සිටින පවුල්වල සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ දත්ත රැස් කිරීම සහ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරිම අරමුණු කර ගනිමින් ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනයක් 2024 වර්ෂයේ දී සිදු කරන ලදි.

මෙම අධ්‍යනය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් ග්‍රාම නිලධාරි වසම් 100 කින් නිවාස ඒකක 1000 ක නියැදියක් තෝරා ගන්නා ලදී. ඒ සඳහා සරල සසම්භාවී ක්‍රමය මෙන්ම ක්‍රමික නියැදීමේ ක්‍රමය ද භාවිතා කල අතර දත්ත රැස් කිරීම සඳහා ගෘහ ඒකක සමීක්ෂණ ක්‍රමය මෙන් ම කඩිනම් තක්සේරු ක්‍රමය ද භාවිතා කරන ලදී.

දත්ත රැස් කිරිමෙන් අනතුරුව අධ්‍යයන ප්‍රතිඵල ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාතික මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර "ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024 - කොළඹ දිස්ත්‍රික්කය" වාර්තාව සකස් කර මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.

- **A study on the Impact of Factory Inspections on Legal Compliance and Occupational Safety & Health Standards in Industries (Pilot Project conducted by Industrial Safety Division and Occupational Hygiene Division of the Department of Labour)**

කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්තමය සුරක්ෂිතතා අංශය සහ වෘත්තීය ස්වස්ථතා අංශය විසින් ඒකාබද්ධව සිදු කරන ලද මෙම අධ්‍යයනය මගින් කර්මාන්තශාලා ලියාපදිංචියේ පැවති දුර්වලතා, අනතුරු පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීම සඳහා භාවිතා කරනු ලබන General Register පවත්වාගෙන යාමේ දුර්වලතා, ප්‍රථමාධාර පහසුකම්වල පැවති දුර්වලතා ආදී කර්මාන්තශාලාවන්හි පැවති අඩුපාඩු

සහිත අංශ හඳුනා ගන්නා ලදී. ඒ අනුව කර්මාන්තශාලාවන්හි පැවති එම දුර්වලතා ඉදිරියේදී අවම කර ගැනීම සඳහා මෙම අධ්‍යයන වාර්තාව මගින් ඉදිරිපත් කර ඇති නිර්දේශ පදනම් කර ගෙන, ඉටු කළ යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලසුමක් සකස් කර 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

### 2.12.3 ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම

- **ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන 2024**



2024.03.08 දිනට යෙදී තිබූ ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ කාන්තා දින සැමරුම් වැඩසටහන 2024.03.07 දින කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී.

"කාන්තාවන්ට බලපාන කම්කරු නීතිය" සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය මගින් ප්‍රජාව දැනුවත් කිරිම සඳහා කෙටි වීඩියෝ පට නිර්මාණ තරගයක් පවත්වා එම තරගයේ ජයග්‍රාහකයන් වෙත සහතිකපත්‍ර ලබා දීම සිදු කරන ලදී. එමෙන්ම විශ්ව විද්‍යාල සිසුන් වෙනුවෙන් කාන්තාවන්ට බලපාන කම්කරු නිතීය පිළිබඳව විවෘත සාකච්ඡා මණ්ඩපයක් ද පවත්වන ලදී. ඒ සඳහා ශ්‍රම වාසනා අරමුදලේ දායකත්වය ද හිමි විය.

- **ලෝක ළමා ශ්‍රම විරෝධී දින වැඩසටහන - 2024**





2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ජුනි මස 12 වන දිනට යෙදෙන "ලෝක ළමා ශ්‍රම විරෝධී දිනය" ට සමගාමීව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ වැඩසටහන, 2024.06.18 වන දින කම්කරු මහලේකම් කාර්යාලයේ 10 වන මහල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. එහිදී, ළමා ශ්‍රමය තුරන් කිරීමේ කාර්යය ප්‍රවර්ධනය උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව සහ කාර්මික සංවර්ධන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් ද අත්සන් තබන ලද අතර, කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක කාර්මික උද්‍යාන වල පිහිටි ආයතන 61ක සේවායෝජකයන් විසින් තම ආයතන ළමා ශ්‍රමයෙන් තොරව පවත්වාගෙන

යන බවට ප්‍රතිඥාවක්ද ලබා දෙන ලදී. එසේම, ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳව විධිමත් අංශයේ ආයතන වෙතින් ප්‍රතිඥා ලබා ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ නව වෙබ් අඩවිය මගින් QR කේතයක් හඳුන්වාදීම ද මෙම වැඩසටහනේදී සිදු කරන ලදී.

- **ලෝක ළමා දින සැමරුම් වැඩසටහන - 2024**

ළමයින්, ළමා ශ්‍රමයෙන් මුදවා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ මහජන අවධානයට යොමු කිරීමේ අරමුණ පෙරදැරිව කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සැමරුම් උත්සවයක් පවත්වනු ලබයි. 2024 වර්ෂය සඳහා එම වැඩසටහන 2024.10.01 දින දෙහිවල, බප / පිළි / සුබෝධ ආදර්ශ කනිෂ්ඨ විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පවත්වන ලදී. “ළමා ශ්‍රමය පිටු දකිමු” තේමාව යටතේ කොළඹ දිස්ත්‍රික්කය තුළ පැවැත්වූ පෝස්ටර් නිර්මාණ තරඟයේ ජයග්‍රාහකයන් වෙත ත්‍යාග සහ සහතික පත්‍ර ප්‍රදානය ද එහිදී සිදු කරන ලදී. එසේම, ළමා ශ්‍රමය පිළිබඳ නීතිමය තත්ත්වය සහ දරුවන් ළමා ශ්‍රමයෙන් මුදවා ගැනීමේ පුරවැසි වගකීම පිළිබඳ පාසල් ළමුන්, ගුරුවරුන් මෙන්ම දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සතිය**

ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සතිය වෙනුවෙන් වෘත්තීය ස්වස්ථතාවය සහ සෞඛ්‍ය සම්බන්ධ පුහුණු වැඩමුළු තුනක් පවත්වන ලදී.

| **පුහුණු වැඩමුළු පැවැත්වූ දිනය** | **පුහුණු වැඩමුළු පැවැත්වූ ස්ථානය** | **සහභාගී වූ සේවක/සේව්‍ය සංඛ්‍යාව** |
|---|---|---|
| 2024.10.23 | කාර්මික සංවර්ධන මණ්ඩලයේ පානළුවේ පිහිටි කාර්මික ජනපදය | 35 |
| 2024.10.29 | හොරණ අරමණාගොල්ල පිහිටි කාර්මික ජනපදය | 45 |
| 2024.10.25 | වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (දෙමළ මාධ්‍යයෙන්) | 33 |

## 2.13 දෙපාර්තමේන්තුවේ මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සිදු කිරීම, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්ය සාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම ගැන්වීම, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු සහ කාර්ය මණ්ඩලයේ විනය කටයුතු යන දෛනික කාර්ය මණ්ඩල පරිපාලන කටයුතු 2024 වර්ෂයේදී ද සිදු කරන ලදී.

2024.12.31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2024.12.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 217 | 126 | 91 |
| තෘතීය මට්ටම | 668 | 504 | 164 |
| ද්විතීය මට්ටම | 1928 | 1671 | 257 |
| ප්‍රාථමික මට්ටම | 476 | 410 | 66 |
| **එකතුව** | **3289** | **2711** | **578** |

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා නිලධරයන් බඳවා ගැනීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| තනතුර | සම්පූර්ණ කළ යුතු වූ පුරප්පාඩු සංඛ්‍යාව | විභාගය පැවැත්වීමට යෝජිතව තිබූ දිනය | විභාගය පැවැත්වූ දිනය | නිලධාරීන් බඳවා ගැනීම | |
|---|---|---|---|---|---|
| | | | | දිනය | නිලධරයන් සංඛ්‍යාව |
| කම්කරු නිලධාරි II ශ්‍රේණිය | 59 | 2022 මාර්තු | 2023.04.29 | 2024.05.07 | 57 |

බඳවා ගන්නා ලද නවක කම්කරු නිලධාරීන් 57 දෙනා සඳහා 2024.05.08 දින සිට 2024.09.06 දින දක්වා සේවාරම්භක පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව 2024.09.09 දින දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල සහ අංශ වෙත අනුයුක්ත කරන ලදී.

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| තනතුර | කාර්යක්ෂමතා විභාගයේ නම | විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලද නිලධරයන් සංඛ්‍යාව | විභාගය පැවැත්වූ දිනය | විභාගය සඳහා සහභාගී වූ නිලධරයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 11 | 2024.12.16, 2024.12.17 සහ 2024.12.18 | 09 |
| කම්කරු නිලධාරි - II ශ්‍රේණිය | පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 06 | 2024.09.30 සහ 2024.10.01 | 02 |
| මානව සම්පත් සංවර්ධන නිලධාරී - II ශ්‍රේණිය | දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 01 | 2024.08.26 | - |

| | | | | |
|---|---|---|---|---|
| මානව සම්පත් සංවර්ධන නිලධාරී - II ශ්‍රේණිය | දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 01 | 2024.11.25 | 01 |
| කාර්යාල සේවක සේවය - III, II සහ I ශ්‍රේණි | පළමු, දෙවන සහ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ | 44 | 2024.12.18 සහ 2024.12.19 | 42 |
| ඒකාබද්ධ රියදුරු සේවය - II ශ්‍රේණිය | දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 03 | 2024.01.17 | 03 |
| වඩු කාර්මික - II ශ්‍රේණිය | දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 01 | 2024.07.18 | 01 |

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සම්මුඛ පරීක්ෂණ මගින් නිලධාරීන් බඳවා ගැනීම

| තනතුර | සම්පූර්ණ කළ යුතු වූ පුරප්පාඩු සංඛ්‍යාව | ඒ අනුව, නිලධරයන් බඳවා ගන්නා ලද | |
|---|---|---|---|
| | | දිනය | නිලධරයන් සංඛ්‍යාව |
| කාර්යාල සේවක සේවය - III ශ්‍රේණිය | 35 | 2024.08.02 | 09 |

එසේම, දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම, බාහිර ආයතන විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා වෙත නිලධාරීන් යොමු කිරීම, සේවා අවශ්‍යතාවය පරිදි උපාධි හා පශ්චාත් උපාධි හැදෑරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නිලධාරීන් වෙත සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

දේශීය පුහුණු වැඩසටහන් සඳහා 2024 වර්ෂය සඳහා රු. 10,400,000.00 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ඒ අතුරින් 2024.12.31 දිනට වියදම රු. 8,546,920.00 ක් වන අතර වියදම ප්‍රතිපාදනයන්හි ප්‍රතිශතයක් ලෙස 82% කි. මේ සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු 06 පරිච්ඡේදයෙහි සඳහන් කර ඇත.

ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන්හි කාර්ය මණ්ඩලය සඳහා කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේදයක් (Performance Evaluation System) සහ මූල්‍යමය නොවන සේවය ඇගයීමේ ක්‍රමවේදයක් (Non Financial Rewarding System) සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) තාක්ෂණික සහය ලබා ගැනීමට ඉල්ලීමක් සිදු කරන ලද අතර එමගින් ඉදිරිපත් කරනු ලබන සැලැස්ම අනුව 2025 වර්ෂයේදී ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

එසේම, Code of Ethics for officers for service delivery of the Department of Labour සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් සිදු කර එහි ඉදිරි කටයුතු සිදු කිරීමට 2025 වර්ෂයේදී සැලසුම් කර ඇත.

කම්කරු දෙපාර්තමේන්තුවේ අංශ සඳහා පුහුණු මොඩියුල (Training Modules) කෙටුම්පත් කිරීමේ කටයුතු 2024 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2025 වර්ෂයේදී කමිටුවක් මගින් මෙම කෙටුම්පත් කරන ලද පුහුණු මොඩියුල වඩාත් යෝග්‍ය පරිදි සකස් කිරීමට සැලසුම් කර ඇත.

## 2.14 දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් සංවර්ධනය

දිවයින පුරා විසිරී සිටින සේවාලාභීන්ට වඩාත් ඵලදායී සේවයක් සලසා දීමේ අරමුණ පෙරදැරිව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි සහ දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන් හි යටිතල පහසුකම් සංවර්ධනයට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.
ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාලයන් හි අවශ්‍යතාවය පරිදි සුළු අළුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර, මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ සහ කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු සිදු කරන ලදී.
2024.12.31 දින වන විට මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 16 මහලේ අභ්‍යන්තර නිර්මිත සකස් කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පැවති අතර, කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 3, 4 සහ 5 මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පැවතිණි.
එසේම, සේවාලාභීන් වෙත එකම ස්ථානයක් තුළින් සේවක අර්ථසාධක අරමුදල් ආශ්‍රිත සේවාවන් ඉටුකර ගැනීම සඳහා කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි පළමු මහලේ නව කාර්යාල පරිශ්‍රය 2024.08.06 දින විවෘත කිරීමට කටයුතු කරන ලදී.

## 2.15 දෙපාර්තමේන්තුවේ කාර්ය අධීක්ෂණය මගින් ඉලක්ක කරා මෙහෙයවීම

2024 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ වන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුවේ අංශයන් කටයුතු කරනු ලබන ආකාරය සහ ප්‍රගතිය පරීක්ෂා කරන ලදී. ඒ අනුව, කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම තුළින් එක් එක් අංශයන්හි ප්‍රගතිය සහ අංශයන්හි කටයුතු සිදු කරගෙන යාමේදී මතු වී ඇති පරිපාලන ගැටළු සම්බන්ධයෙන් උපදෙස් සහ විසඳුම් ලබා දීමට කටයුතු කරන ලදී.

කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු විසින් සිය කලාපයට අදාල දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි 2024 වර්ෂයේ පළමු, දෙවන සහ තෙවන කාර්තුවලට අදාල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් මගින් දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ උප කම්කරු කාර්යාල වල ප්‍රගතිය අධීක්ෂණය සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා නිර්දේශ ලබා ගන්නා ලදී. ඒ අනුව, ලබා දී ඇති නිර්දේශ අනුව ප්‍රගතිය අධීක්ෂණය 2025 වර්ෂයේ දී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

එසේම, ප්‍රධාන කාර්යාලය මගින් ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ද දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවන ලද අතර 2024 වර්ෂය අවසන් වන විට කමිටු සාකච්ඡා සිදු කරමින් පැවති අතර කමිටු නිර්දේශ අනුව 2025 වර්ෂයේදී ඉදිරි පියවර ගැනීමට සැලසුම් කර ඇත.

## 2.16 මූල්‍ය කළමනාකරණය

2024 වර්ෂය සඳහා වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස අදාළ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

ඒ අනුව, 2024.12.31 දින වන විට පුනරාවර්තන වියදම් ප්‍රතිපාදනයන්ගෙන් 95.2% ක ප්‍රතිශතයක් ද ප්‍රාග්ධන වියදම් ප්‍රතිපාදනයන්ගෙන් 22.5% ක ප්‍රතිශතයක් ද භාවිතා කරමින් මූල්‍ය කළමනාකරණ ඉලක්ක සපුරා ගෙන ඇත.

| | **2024 වර්ෂය සඳහා ප්‍රතිපාදනය (රු)** | **2024.12.31 දිනට වියදම (රු)** | **ප්‍රතිපාදනයන් හි ප්‍රතිශතයක් ලෙස සත්‍ය වියදම** |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 3,018,000,000 | 2,873,402,559 | 95.2 % |
| ප්‍රාග්ධන වියදම් | 1,403,925,000 | 316,159,332 | 22.5 % |

ප්‍රාග්ධන වියදම් යටතේ ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු සිදු කිරීමේ ක්‍රියාකාරකම් පනහක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද කම්කරු දෙපාර්තමේන්තුව වෙත පවතින තාක්ෂණ කාර්යයන්ට අදාළ ඉංජිනේරු සහ තාක්ෂණ නිලධාරී හිඟය හේතුවෙන් එම කාර්යයන් බාහිර ආයතන මගින් සිදු කරවා ගත යුතු විය. එම ආයතන මගින් ප්‍රමාණ පත්‍ර සහ මිල ගණන් කැඳවීමේ ලේඛන ආදිය සකස් කර දීම ප්‍රමාද වීම හේතුවෙන් ගොඩනැගිලි අළුත්වැඩියාවන්ට අදාළ කටයුතු වල සැළකිය යුතු ප්‍රමාදයක් සිදු විය. ඒ හේතුවෙන් 2024 වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රතිපාදන වැය කිරීමේ ප්‍රගතියේ අඩුවක් සිදු විය.

මෙම ගැටළුවට විසඳුමක් වශයෙන් 2025 වර්ෂයේදී නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සුදුසු උපදේශන ආයතනයක් තෝරා ගෙන මෙම කටයුතු වඩාත් කාර්යක්ෂම ආකාරයෙන් සිදු කිරීමට සැලසුම් කර ඇත.



**එච්.කේ.කේ.ඒ.ජයසුන්දර**

**කම්කරු කොමසාරිස් ජනරාල්**

# තෙවන පරිච්ඡේදය

# 2024 දෙසැම්බර් 31 දිනෙන්

# අවසන් වූ වසර සඳහා වන

# සමස්ත මූල්‍ය කාර්යසාධනය

# 3.1 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | | | | | ඒසීඒ-එෆ් |
|---|---|---|---|---|---|
| | **2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය** | | | | |
| **සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024** | | **සටහන** | **තත්‍ය 2024** | **තත්‍ය 2023** | |
| **රු.** | | | **රු.** | **රු.** | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | **1** | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | **2** | - | - | **ඒසීඒ-1** |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | **3** | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | **4** | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | **-** | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,702,735,000 | 1,405,846,000 | **ඒසීඒ-3** |
| - | තැන්පතු | | 4,164,557,714 | 3,876,444,205 | **ඒසීඒ-4** |
| - | අත්තිකාරම් ගිණුම් | | 131,681,603 | 122,739,450 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **5,998,974,317** | **5,405,029,654** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **5,998,974,317** | **5,405,029,654** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | - | 83,240,565 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | 5,998,974,317 | 5,321,789,089 | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | **-** | - | |
| 1,985,600,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 1,967,273,776 | 1,708,472,497 | |
| 1,012,500,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 892,596,065 | 813,472,042 | **ඒසීඒ-2(ii)** |
| 19,401,860 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 13,034,578 | 13,863,206 | |
| - | පොළී ගෙවීම් | **8** | - | - | |
| 498,140 | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | 498,139 | - | |
| **3,018,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **2,873,402,559** | **2,535,807,745** | |
| | **මූලධන වියදම්** | | | | |
| 1,032,900,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 257,261,044 | 86,065,584 | |
| 359,625,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 50,063,883 | 33,270,520 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | | - | **ඒසීඒ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 10,400,000 | හැකියා වර්ධනය | **14** | 8,546,920 | 4,062,418 | |
| 1,000,000 | වෙනත් මූලධන වියදම් | **15** | 287,485 | 346,275 | |
| **1,403,925,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **316,159,332** | **123,744,798** | |
| | තැන්පතු ගෙවීම් | | 4,280,930,828 | 3,681,525,657 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 125,267,485 | 139,905,842 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **4,406,198,313** | **3,821,431,499** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **7,595,760,204** | **6,480,984,041** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(1,596,785,887)** | **(1,159,194,953)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (1,609,554,880) | (1,159,194,953) | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 12,768,993 | | **ඒසීඒ-3** |
| | | | (1,596,785,887) | (1,159,194,953) | |

## 3.2 2024.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | | |
|---|---|---|---|
| | | | **ඒසීඒ -පී** |
| **2024 දෙසැම්බර් 31 දිනට** | | | |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය** | | | |
| | | තත්‍ය | |
| | සටහන | **2024** | **2023** |
| | | රු. | රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ -6 | 17,989,260,234 | 17,824,004,744 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ -5/5(ඒ) | 267,692,902 | 274,107,020 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ -3 | 12,768,993 | - |
| **මුළු වත්කම්** | | **18,269,722,130** | **18,098,111,763** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (578,590,517) | (688,549,513) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 17,989,260,234 | 17,824,004,744 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ -5(බී)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ -4 | 846,283,419 | 962,656,533 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ -3 | 12,768,993 | - |
| **මුළු වගකීම්** | | **18,269,722,130** | **18,098,111,763** |

## 2024.12.31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පිටු අංක 10 සිට 42 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 43 සිට 52 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

..............................

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

නම : එස්.එම්. පියතිස්ස

තනතුර : ලේකම්, කම්කරු අමාත්‍යාංශය, 7 වන මහල, "මෙහෙවර පියස", නාරාහේන්පිට, කොළඹ 05.

දිනය : 2025.02. 28

..............................

ගණන්දීමේ නිලධාරි

නම : එච්.කේ.කේ.ඒ. ජයසුන්දර

තනතුර : කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු දෙපාර්තමේන්තුව, කොළඹ 05.

දිනය : 2025.02. 28

..............................

ප්‍රධාන ගණකාධිකාරි

නම :

දිනය : 2025.02.28

වී. වී. ප්‍රියන්ත
ප්‍රධාන ගණකාධිකාරි
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

# 3.3 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | |
|---|---|---|
| | | **ඒසීඒ-සී** |
| **2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය** | | |
| | සටහන | |
| | **2024** | **2023** |
| | රු. | රු. |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 1,612,476,844 | 1,153,377,936 |
| අග්‍රිම ලැබීම් | 1,702,735,000 | 1,405,846,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 143,085,055 | 132,455,074 |
| තැන්පතු ලැබීම් | 4,164,557,714 | 3,876,444,205 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **7,622,854,613** | **6,568,123,215** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,845,654,575 | 2,509,086,774 |
| සහනාධාර සහ මාරුකිරීම් | 13,532,717 | 13,863,206 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 36,886,503 | 29,565,347 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | 83,240,565 |
| අත්තිකාරම් ගෙවීම් | 125,815,190 | 139,559,050 |
| තැන්පතු ගෙවීම් | 4,280,930,828 | 3,681,525,657 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **7,302,819,814** | **6,456,840,600** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **320,034,799** | **111,282,615** |
| | | |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 307,265,806 | 111,282,615 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **307,265,806** | **111,282,615** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(307,265,806)** | **(111,282,615)** |
| | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **12,768,993** | **-** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **12,768,993** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **12,768,993** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

<u>වාර්තා කිරීමේ පදනම</u>

1) <u>පිළියෙල කිරීමේ අරමුණ</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු

සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම “වාර්තාකරණ පදනම” යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.
* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| **අදාළ නොවේ.** | | | | | |

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස |
|---|---|---|---|
| පුනරාවර්තන | 3,018,000,000 | 2,873,402,559 | 95.2 % |
| මූලධන | 1,403,925,000 | 316,159,332 | 22.5 % |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %ක් ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 1 | කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 118-1-2-0-1001 | සංවර්ධන නිලධාරී සේවයේ නියුක්ත වූ අයෙක් පරිපාලන සේවයට නිදහස් කිරීමේදී සංවර්ධන නිලධාරී සේවයේ වැඩියෙන් ගෙවූ වැටුප අයකර ගැනීම. | - | - | (19,220.97) | - |
| 2 | කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 118-1-2-0-1003 | | - | - | (13,874.19) | - |
| 3 | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 130-1-2-0-1001-11 | උපාධිධාරී පුහුණු නිලධාරීන්ගේ දීමනා ගෙවීම. | 1,091,250.00 | 1,091,250.00 | 654,750.00 | 60% |
| 4 | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 130-1-2-0-1003-11 | උපාධිධාරී පුහුණු නිලධාරීන්ගේ දීමනා ගෙවීම. | 1,543,500.00 | 1,543,500.00 | 1,088,100.00 | 70% |
| 5 | කම්කරු අමාත්‍යාංශය - විදේශ රැකියා අංශය | 193-1-14-0-1403-11 | ජල හා විදුලිය වෙනුවෙන් වියදම් දැරීම | 5,377,281.43 | 5,377,281.43 | 5,377,281.43 | 100% |
| 6 | කම්කරු අමාත්‍යාංශය - විදේශ රැකියා අංශය | 193-1-14-0-1404-11 | බදු කුලී වියදම් දැරීම | 1,295,910.00 | 1,295,910.00 | 1,295,910.00 | 100% |
| 7 | කම්කරු අමාත්‍යාංශය - විදේශ රැකියා අංශය | 193-1-14-0-1409-140-11 | මෙහෙවර පියෙස පහසුකම් කළමනාකරණ ගාස්තු | 3,362,951.17 | 3,362,951.17 | 3,362,951.17 | 100% |
| 8 | කම්කරු අමාත්‍යාංශය | 193-1-2-0-1403-11 | අමාත්‍යාංශයේ ජල හා විදුලිය වෙනුවෙන් වියදම් දැරීම | 9,456,035 | 9,456,035 | 9,456,035 | 100% |
| 9 | කම්කරු අමාත්‍යාංශය | 193-1-2-0-1404-11 | අමාත්‍යාංශයේ බදු කුලී වියදම් දැරීම | 1,555,092 | 1,555,092 | 1,555,092 | 100% |
| 10 | කම්කරු අමාත්‍යාංශය | 193-1-2-0-1405-11 | අමාත්‍යාංශයේ පිරිසිදු කිරීමේ වියදම් දැරීම | 325,541.10 | 325,541.10 | 325,541.10 | 100% |
| 11 | කම්කරු අමාත්‍යාංශය | 193-1-2-0-1409-140-11 | මෙහෙවර පියෙස පහසුකම් කළමනාකරණ ගාස්තු | 3,710,000.28 | 3,710,000.28 | 3,710,000.28 | 100% |
| 12 | කම්කරු අමාත්‍යාංශය | 193-1-2-2-2509-11 | සුනිසි මෙහෙවර වැඩසටහන වෙනුවෙන් වියදම් දැරීම. | 8,488,000.00 | 8,488,000.00 | 6,182,352.22 | 73% |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | **31.12.2024** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **31.12.2024** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 2,865,777,749.65 | 2,865,777,749.65 | | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 808,158,488.35 | 808,158,488.35 | | 100% |
| 9153 | ඉඩම් | 2,262,720,000.00 | 2,262,720,000.00 | | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 52,351,728.54 | 52,351,728.54 | | 100% |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | 12,000,252,267.79 | 12,000,252,267.79 | | 100% |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | | |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } LSW/B/DOL/SR/01/2024    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2025 ජූලි [illegible] දින

ගණන්දීමේ නිලධාරී
කම්කරු දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 07 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කම්කරු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන'වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමෙ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කම්කරු දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කම්කරු දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමෙ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමෙ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම්

කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු සඳහා වැයකරන මුදල් මාසිකව ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ප්‍රතිපූරණය කරගන්නා අතර, 2024 වර්ෂයේදී එලෙස ප්‍රතිපූරණය කරගත් රු.967,027,707 ක මුදල ආදායම් ශීර්ෂයකට බැර කිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම ලෙස සාවද්‍ය අගයක් සටහන්ව පැවතුනි.

### 1.6.2 මුලධන වියදම්

(අ) 2024 වර්ෂයේ මිලදීගත් රු.3,777,444 ක් වූ පරිගණක මෘදුකාංග දෙපාර්තමේන්තුවේ වත්කම් ලෙස වාර්තා කර තිබූ අතර, 2024 වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙසද වාර්තාකර තිබුනි.

(ආ) සේවක අර්ථසාධක අරමුදලේ කාර්යයන් සඳහා ප්‍රතිපාදන තුලින් දරන ලද වියදම ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ප්‍රතිපූරණය කරගැනීම හා එලෙස ප්‍රතිපූරණය කළ මුදල කම්කරු දෙපාර්තමේන්තුවේ අදාල වැය විෂයයන්ට අධිභාර කිරීම කළ යුතු වුවද, එකී ක්‍රමවේදය අනුගමනය නොකිරීම හේතුවෙන් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් රු.967,027,707 ක් වූ වියදම් සේවක අර්ථසාධක අරමුදලෙහි වියදම් ලෙසද නැවත වාර්තාකර පැවතුනි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද 2024 වර්ෂය සඳහා පිළියෙල කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ACA 6 ආකෘතියේ ඇතුලත් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අවසාන ශේෂයන් අතර වෙනස්කම් මෙම වාර්තාවේ 1.5.2 ඇති සටහන් කර ඇත. එම විගණන නිරීක්ෂණය අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

(අ) වැය විෂයයන් 3 කට අදාලව සලසා තිබූ රු.192,500,000 ක් වූ ප්‍රතිපාදනයන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ කිසිඳු වියදමක් දරා නොතිබීමත් සියයට සියයක ප්‍රතිපාදන ඉතිරිවීම් නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයයන් 14 කට අදාලව සලසා තිබූ රු.1,157,501,540 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.258,900,994 ක් පමණක් උපයෝජනය කර තිබුනි. මෙම ඉතිරියේ ප්‍රතිශතය සියයට 44 සිට සියයට 96 ක් දක්වා පරාසයක් තුළ පැවතුනි.

### 3.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXXIV පරිච්ඡේදය | |
| 4.5 හා 4.6 වගන්ති | (i) ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට නොහැකිව පවතින සමාලෝචිත වර්ෂය අවසානයේ සේවය හැරගිය, වැඩ තහනම් කළ හා සේවයෙන් පහකළ නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.1,914,316 ක් වූ අතර ඉන් රු.384,060 ක ශේෂ 6 ක් වසර 10 ඉක්මවූ ඒවා ඉක්මවූ ඒවා විය. |

(ii) මියගිය නිලධාරීන් 4 දෙනකුගෙන් අයවිය යුතු ණය ශේෂ රු.287,752 ක් වූ අතර ඒ අතුරින් වසර 1-3 අතර රු.153,792 ද වසර 3-5 අතර රු.10,000 ක්ද වසර 10 ට වැඩි රු.123,960 ක ශේෂයක්ද පැවතුනි.

| | | |
|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 16 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | දෙපාර්තමේන්තුව සතුව වාහන 87 ක් පැවතියද රථවාහන 80 ක ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුනි. |
| (ඇ) | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 05/2020 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 | දෙපාර්තමේන්තුව සතු ආර්ථික වශයෙන් ඵලදායී නොවන තත්ත්වයේ පවතින වාහන හඳුනාගෙන අපහරණය කිරීම සිදුකල යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී මෙම කාර්යභාරය අවසන්ව නොතිබුනි. |
| (ඈ) | 2019 සැප්තැම්බර් 27 දින අංක 2142/90 දරණ අති විශේෂ ගැසට් පත්‍රය | ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව කර්මාන්තශාලා නව ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත් පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කර නොතිබුනි. |

**3.3** තැන්පතු

(අ) දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් තැන්පත් ගිණුමෙහි 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.24,313,744 ක් වූ අතර, එකී ශේෂය තුළ රු.16,327,781 ක් වූ වසර 2 කට වඩා කල් ඉකුත් වූ මෙහෙවර පියෙස ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් සිදුකරන ලද තැන්පතු බවට අනාවරණය විය.

(ආ) කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම තුල 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.821,969,675 ක් පැවති අතර ඉන් 2015 ට පෙර පැවති EPF (වන්දි හා පාරිතෝෂික) හි එකතුව රු.7,022,106 ක මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුනි. 2016 වර්ෂයේ සිට 2024 දක්වා පැවති රු.349,186,269 ක මුදලින් 2025 අප්‍රේල් වන විට තවදුරටත් නිරවුල් කිරීමට ඇති ශේෂය රු.311,596,989 ක් විය.

(ඇ) 2024 වර්ෂයට අයත් හිමිකම් ගිණුම්වල අදාල දිස්ත්‍රික් කාර්යාලවලට යවා ඇති නමුත් 2025 මැයි මාසය වන විටත්, මැද කොළඹ, බටහිර කොළඹ හා දකුණු කොළඹ කාර්යාලවල පිළිවෙලින් රු.1,539,544, රු.222,740 හා රු.403,600 ක ශේෂයන් වශයෙන් ගෙවීමට පැවතුනි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 දැක්ම හා මෙහෙවර

එක් වහලක් යටදී සියලු කටයුතු ඉටුකර ගැනීමේ අරමුණ ඇතිව 2008 මැයි 12 දින අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ සිට සාමාජික මුදල් ගෙවීම පැහැරහරින හාම්පුතුන්ට විරුද්ධව නඩු පැවරීම, සාමාජිකයාගේ ප්‍රතිලාභ ලබා ගැනීම පහසු කරවන සේවක ආර්ථසාධක අරමුදල් ලේකම් කාර්යාලය, මහා බැංකු නිලධාරීන්ගෙන් සමන්විත පරිපාලන ඒකකයක්, නඩු විභාග කිරීමට මහේස්ත්‍රාත් අධිකරණයක්, සාකච්ඡා ශාලාවක්, භෝජනාගාරයක් සඳහා ඉඩකඩ වෙන්කර දීම මෙහෙවර පියෙස ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුණ වුවද, එකී කාර්යය ඉටුවී නොතිබුණි. 2024 දෙසැම්බර් වන විට කම්කරු විෂය පථයට සෘජුව අදාල නොවන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (24,25 මහල්) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (26,27 මහල්) බදු කුලී අයකිරීමෙන් තොරව භාවිතා කරමින් පවතින බවට නිරීක්ෂණය විය.

#### 4.1.2 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

කොග්ගල හා කටුනායක නේවාසිකාගාරවල අළුත්වැඩියාවන් සඳහා 2023 වර්ෂයේදී රු.6,000,000 ක ප්‍රතිපාදනද සමාලෝචිත වර්ෂයේදී රු.2,500,000 ක ප්‍රතිපාදනද වෙන්කර තිබූ නමුත් අපේක්ෂිත කාර්යය ඉටුකර නොතිබුණි.

#### 4.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) 2023 වර්ෂයේදී මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 16 වන මහලේ අභ්‍යන්තර පිරිවිතය සැකසීම සඳහා රු.30,000,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කරවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු.36,880,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ආරම්භවීම 2024 ඔක්තෝම්බර් දක්වා ප්‍රමාද වීම හේතුවෙන් අදාල ව්‍යාපෘතිය 2024 වර්ෂයේදී ද ඉටුකර ගැනීමට හැකියාව ලැබී නොතිබුණි.

(ආ) මෙහෙවර පියෙස ගොඩනැගිල්ල 2019 අගෝස්තු 20 දින විවෘත කර කාර්යාල කටයුතු පවත්වාගෙන ගොස් ඇති නමුත් කසල කළමනාකරණ කාර්යසාධන වැඩසටහන 2024 වර්ෂය අවසානය වන විටත් ඉටුකර ගැනීමට හැකිව නොතිබුණි. මේ සඳහා 2023 වර්ෂයේදී රු.5,000,000 ක ප්‍රතිපාදනද, 2024 වර්ෂයේ රු.13,000,000 සලසාගත් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

#### 4.1.4 මුදල් නිදහස් කර තිබුනත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

2019 වර්ෂයේ රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ අළුත්වැඩියාවන් සඳහා මූලික ඇස්තමේන්තුවක් මත ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු.11,177,000 ක මුදලක් ගෙවා තිබුණි. මූලික ඇස්තමේන්තුවේ වහලය හා සිවිලිම අළුත්වැඩියාව සඳහා රු.1,922,500 ක පිරිවැයක් ඇතුලත්කර තිබූ අතර, අළුත්වැඩියාවේ ස්වභාවය මූලික ඇස්තමේන්තුවේ විග්‍රහ කිරීමක් සිදුකර නොතිබූ අතර, යොදනු ලබන ලී, ඇස්බැස්ටෝස් යනාදිය පිළිබඳව පැහැදිලි සඳහනක් නොවිය. විගණන අවස්ථාව වූ 2024 අගෝස්තු වන විට වර්ෂාව පවතින අවස්ථාවලදී වහලයෙන් සිවිලිම ඔස්සේ ජල කාන්දුවීම් සිදුවූ අතර, ආහාර ගන්නා ස්ථානයේ විදුලි පංකාව ඔස්සේ සිදුවන ජල කාන්දුව හේතුවෙන් විදුලිය අක්‍රිය වීම් සිදුවෙමින් පැවතියද මේ පිළිබඳව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව දැනුවත්කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කළමනාකරණ විසින් සිදුකර තිබුණි.

**4.1.5 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය වෙතින් සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලබාදුන් ප්‍රතිපාදන මුදල් රු.8,488,000 ක් අතුරින් රු.6,178,202 ක් පමණක් භාවිත කර තිබුණි. ඒ අනුව ඉතිරියෙහි සමස්ථ ප්‍රතිශතය සියයට 27 ක් බවට අනාවරණය විය. මේ අතුරින් සමාජ කතිකා හා වැඩපළ සහයෝගීතා අංශය වෙත ලබාදුන් ප්‍රතිපාදන සියයට 44 ක් පැවතුනි.

**4.1.6 කළමනාකරණ දුර්වලතා**

(අ) දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන ණය ලේඛන නියැදි පරීක්ෂාවකදී (CC10) විධිමත්ව පවත්වා නොගැනීම හේතුවෙන් අවස්ථා 9 කදී නිලධාරී 9 දෙනෙකුගේ ණය ශේෂ නිවැරදිව සටහන් නොවීම් හා සාවද්‍ය ලෙස සටහන් වීම් පැවති බවට නිරීක්ෂණය විය.

(ආ) පූර්ව අධ්‍යනයකින් හා ඇගයීමකින් තොරව භාණ්ඩ හා වැඩ ප්‍රසම්පාදන කාර්යයන් 7ක් සඳහා රු.139,270,000ක ප්‍රතිපාදන වෙන්කර තිබුනද ඉඩම්වල ගැටළු පැවතීම, PPP ක්‍රමවේදයක් නිසා අත්හිටුවීම, ඩිජිටල් ක්‍රමවේදයක් හඳුන්වා දීම යන ගැටළු හේතුවෙන් 2024 වර්ෂයේදී එකී කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකිව පැවතුනි.

(ඇ) රු.7,855,576ක මුදලක් වැයකර 2023 වර්ෂයේදී හම්බන්තොට දිස්ත්‍රික් කම්කරු කාර්යාලය හා සංචාරක බංගලාව අළුත්වැඩියා කර තිබුනද, අවශ්‍ය ලීබඩු හා උපකරණ ප්‍රසම්පාදනය නොවීම හේතුවෙන් භාවිතයට ගැනීමෙන් තොරව පැවතුනි.

(ඈ) පවතින කාලගුණ තත්වයන් මත නිරතුරුව විදුලි බිඳවැටීමට ලක්වන රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ විදුලි ජනක යන්ත්‍රය මගින් සේවක අර්ථසාධක ගෙවීම් අංශයට පමණක් ප්‍රමාණවත් සැපයුමක් පවතින බැවින් දෛනික රාජකාරී කටයුතුවලට බාධා එල්ලවන තත්ත්වයක පැවතුනි.

(ඉ) 2017 වර්ෂයේදී ගංවතුරෙන් ලිපිගොනු විනාශ වීමෙන්, ලේඛන සොයාගත නොහැකි බැවින් රු.7,254,381ක මුදලක් රාජ්‍ය අදායමට බැර කිරීමට සූදානම්ව තිබූ බවට නිරීක්ෂණය වූ අතර, අවදානම් සහිත පරිසරයක පවතින කාර්යාල පරිශ්‍රයක් බැවින් එහි තොරතුරු පද්ධතියක් හෝ වෙනයම් ආකාරයක තොරතුරු පවත්වාගෙන යාමට (backup) කටයුතු සිදු නොකිරීම කළමනාකරණ දුර්වලතාවයක් බව නිරීක්ෂණය විය.

**5. මානව සම්පත් කළමනාකරණය**

(අ) දෙපාර්තමේන්තුවෙ 2024 දෙසැම්බර් 31 වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරී පුරප්පාඩු ප්‍රතිශතය සියයට 42ක් වන අතර තෘතිය මට්ටමේ පුරප්පාඩු ප්‍රතිශතය සියයට 25කි. පුරප්පාඩු ප්‍රමාණය ඉහල ප්‍රතිශතයක් ගැනීම මගින් ආයතනික ධූරාවලිය තුල තීරණ ගැනීම, වගකීම් භාර ගැනීම, අධීක්ෂණය සහ මඟ පෙන්වීම වැනි අවස්ථාවන්වලදී ප්‍රායෝගික ගැටළු ඇති විය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුව කම්කරු ක්ෂේත්‍රයට අයත් වන පනත් 14ක පමණ රාජකාරී කටයුතු, විමර්ශණ කටයුතු, දෛනිකව මහජනතාව සම්බන්ධ රාජකාරිවල නිරත වීම හේතුවෙන් කළමනාකරණ සේවයේ නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම කාර්යක්ෂමතවයට බාධා එල්ල වී තිබුණි.

එච්.එම්.ද සොයිසා,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට

# සිව්වන පරිච්ඡේදය

## කාර්යසාධන දර්ශක

# කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| • සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි දින 14 ක් තුළ යැවීමේ ප්‍රතිශතය | | | 71% |
| • 2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර දේශයක් කිරීමේ තිරසාර අරමුණ පෙරදැරිව 2024 වර්ෂය තුළ ඉටු කිරීමට ඉලක්කගත ක්‍රියාකාරකම් ඉටු කිරීමේ ප්‍රතිශතය | 98% | | |
| • ආයතනයන්හි පිහිටුවීමට ඉලක්කගත ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු සංඛ්‍යාවෙන් පිහිටුවනු ලැබූ ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු සංඛ්‍යාවේ ප්‍රතිශතය | | 81% | |
| • කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කර විසඳීමේ ප්‍රතිශතය | 100% | | |
| • සමාජ කතිකාව ප්‍රවර්ධනය සඳහා ආයතන මට්ටමේ වැඩසටහන් පැවැත්වීමට ඉලක්කගත ප්‍රතිශතයෙන් වැඩසටහන් පවත්වන ලද සංඛ්‍යාවේ ප්‍රතිශතය | 100% | | |

# පස්වන පරිච්ඡේදය

# තිරසර සංවර්ධන අරමුණු (SDGs)

# සපුරා ගැනීමේ කාර්යසාධනය

# තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාව විසින් සාක්ෂාත් කර ගත යුතු තිරසර සංවර්ධන අභිමතාර්ථයන් අතරින්, කම්කරු දෙපාර්තමේන්තුවේ මෙහෙවර අනුව 08 වන අභිමතාර්ථය දෙපාර්තමේන්තුව වෙත ඍජුව අදාළ වේ. එනම්, **සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම** යන අභිමතාර්ථය වේ. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර මෙම අභිමතාර්ථය හා සමපාත වන අතර දෙපාර්තමේන්තුවේ සියලු ක්‍රියාකාරකම්හි අවසාන නිමැවුම වනුයේ මෙම අභිමතාර්ථය සාර්ථකව සාක්ෂාත් කර ගැනීම වේ. ඒ අනුව ගත් කල දෙපාර්තමේන්තුවේ සමස්ත ප්‍රගතිය මගින් 08 වන අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය විද්‍යමාන වේ.

මේ හැරුණු කොට 01 වන අභිමතාර්ථය වන සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම, 05 වන අභිමතාර්ථය වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සහ 16 වන අභිමතාර්ථය වන තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම යන අභිමතාර්ථ ද දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් අනුව අඩු වැඩි වශයෙන් අදාළ වේ.

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ

| ඉලක්කය / අරමුණ | | ඉලක්ක | | ජයග්‍රහණ දර්ශක | | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 01 | සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1.1 | 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම. වර්තමාන තක්සේරුව අනුව දිනකට ඩොලර් 1.25ට වඩා අඩුවෙන් අදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ. | 1.1.1 | ස්ත්‍රී පුරුෂභාවය, වයස, සේවා නියුක්ති මට්ටම සහ භූගෝලීය පිහිටීම (නාගරික, ග්‍රාමීය) යන සාධකයන්ට අනුව අන්තර්ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහල ජනගහණයේ අනුපාතය | • තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තයේ සහ රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තයේ අවම දෛනික වේතන ප්‍රමාණය යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී. |
| 05 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම | 5.1 | කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථායන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම | 5.1.1 . | ස්ත්‍රී පුරුෂභාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවතින්නේද නැද්ද යන්න | • 2024.03.08 දිනට යෙදී තිබූ ජාත්‍යාන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ කාන්තා දින සැමරුම් වැඩසටහන 2024.03.07 දින කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී. "කාන්තාවන්ට බලපාන කම්කරු නීතිය" සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය මගින් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා කෙටි වීඩියෝ පට නිර්මාණ තරඟයක් පවත්වා එම තරඟයේ ජයග්‍රාහකයන් වෙත සහතිකපත්‍ර ලබා දීම සිදු කරන ලදී. එමෙන්ම විශ්ව විද්‍යාල සිසුන් වෙනුවෙන් කාන්තාවන්ට බලපාන |
| | | 5.2 | මානව කුට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුලත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම | 5.2.1 | පසුගිය මාස 12ක කාලය තුලදී, හිංසනයේ ස්වභාවය, සහ වයස අනුව, සහකරුවෙක් සිටි/සිටින, වයස අවුරුදු 15ට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමුන් අතරින් කායික, ලිංගික, හෝ මානසික හිංසනයට ලක්වූ ප්‍රමාණය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 5.6 .ඇ. | ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ සියලුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම,ශක්තිමත් කිරීම සහ නීතිමය ලෙස බලාත්මක කිරීම | 5.ඇ. 1 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම හඳුනා ගැනීමට සහ රාජ්‍ය මුදල් වෙන් කිරීමක් සහිත ක්‍රමයන් පවත්නා රටවල් ප්‍රමාණය | කම්කරු නිතිය පිළිබඳව විවෘත සාකච්ඡා මණ්ඩපයක් ද පවත්වන ලදී.<br>• කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමේ කොන්දේසි කඩවීම් පිළිබඳව ලැබුණු පැමිණිලි 09 ක් සම්බන්ධයෙන් වර්ෂය තුළදී පරීක්ෂණ සිදු කර අවසන් කරන ලදී.<br>• කාන්තාවන්ට බලපාන නීති පිළිබඳව සේවයේ නියුතු කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 12 සිදු කරන ලද අතර එමගින් කාන්තා සේවිකාවන් 418 ආවරණය වී ඇත. කාන්තාවන් සවිබලගැන්වීම හරහා නීති කඩවීම් වැළැක්වීමට මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ඉවහල් වනු ඇති බවට අපේක්ෂා කෙරේ. |
| 8 | සියලු දෙනා සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම | 8.5 . | 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 8.5.1 | රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම ඉපැයීම | කම්කරු නීති අනුව පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන් හි සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව හෝ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් නොවේ. |
| | | | | 8.5.2 | ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය | |
| | | 8.7 | බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග | 8.7.1 . | ස්ත්‍රීපුරුෂභාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස | • සෑම වර්ෂයකම ජුනි 12 දිනට යෙදෙන 'ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට' සමගාමීව කම්කරු |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම | | යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව | දෙපාර්තමේන්තුව විසින් 2024.06.18 දින සැමරුම් වැඩසටහනක් පවත්වන ලදී. එහිදී, විධිමත් ක්ෂේත්‍රයන්හි ආයතනවල, විශේෂයෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කාර්මික උද්‍යානවල ස්ථාපිත ආයතනවල සේවායෝජකයන් වෙතින් සිය ආයතන විසින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. එයට සමගාමීව දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය මගින් QR කේතයක් හඳුන්වා දී ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට දිවයිනේ සියලුම ආයතන වෙතින් ප්‍රතිඥාව ලබා ගැනීමේ කටයුතු ද ආරම්භ කරන ලදී.<br>• පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේවා සේවක දෙපාර්ශවය කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති පිළිබඳව පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් මෙන්ම රාජකාරි කටයුතු සිදු කිරීමේදී කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති පිළිබඳව දැනුවත්භාවක් ලැබිය යුතු අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්ද |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කොට පවත්වන ලදී.<br>• ක්ෂේත්‍ර පරීක්ෂණවල යෙදෙන කම්කරු නිලධාරීන් විසින් අවිධිමත් ක්ෂේත්‍රය ප්‍රමුඛ කර ගනිමින් අනෙකුත් සියලුම ක්ෂේත්‍රයන්හි සේවායෝජකයන් වෙතින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීමේ කටයුතුද ආරම්භ කරන ලදී.<br>• කොළඹ දිස්ත්‍රික්කයෙහි ළමා ශ්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය ඇගයීම, ළමා ශ්‍රමිකයන් සිටින පවුල්වල සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ දත්ත රැස් කිරීම සහ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරිම අරමුණු කර ගනිමින් ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනයක් 2024 වර්ෂයේදී සිදු කරන ලදී.<br>• ළමා ශ්‍රමය තුරන් කිරීම හා පුරවැසි වගකීම පිළිබඳ පණිවුඩය බිම් මට්ටම දක්වා රැගෙන යාමේ කටයුතු ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රජා පොලිස් කමිටු හරහා සිදු කිරීම වඩාත් ප්‍රායෝගික බවට හඳුනාගන්නා ලදී. ඒ අනුව, |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | 2024 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි සහ 2025 වර්ෂයේ දී මුළු දිවයිනම ආවරණය වන පරිදි මෙම ජාතික වගකීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීම ආරම්භ කරන ලදී.<br>• ළමා ශ්‍රමය පිළිබඳව ලද පැමිණිලි 101ක් සම්බන්ධයෙන් 2024 වර්ෂයේදී පරීක්ෂණ සිදු කරන ලදී. එහිදී ළමා ශ්‍රමයක් ඇති බවට අනාවරණය වූ පැමිණිලි 02 කි. ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| | | 8.8. | කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම, විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුලු සංක්‍රමණිකයින් සහ අවධානම් සහගත රැකියාවල නිරත වුවන් ඇතුලත්ව වැඩ කරන සියලුදෙනා සඳහා | 8.8.1. | ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික තත්ත්වය අනුව රැකියාව ආශ්‍රිත මාරක සහ මාරක නොවන අනතුරු සිදුවීමේ අනුපාතයන් | • 2024 වර්ෂය තුළදී සේවා ස්ථාන ආශ්‍රිතව ඇතිවූ මරණීය අනතුරු 47ක් හා මරණීය නොවන අනතුරු 1606ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. මෙම අනතුරු විමර්ශනය කර අදාළ නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීමත් අනතුරට |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම | 8.8.2. | ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික මට්ටම් අනුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ලේඛන මූලාශ්‍ර ජාතික ව්‍යවස්ථාව පදනම්ව කම්කරු අයිතිවාසිකම් (රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස) සම්බන්ධයෙන් ඇති ජාතික අනුකූලතාවයේ මට්ටම | හේතු සොයා ගැනීම තුළින් එවැනි අනතුරු නැවත සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට සේවායෝජකයින් දැනුවත් කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. ඒ අනුව, කර්මාන්තශාලා ආඥා පනත උල්ලංඝනය වන පරිදි කටයුතු කළ සේව්‍යයන් 16දෙනෙකුට එරෙහිව වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් නෛතික ක්‍රියා මාර්ග ගන්නා ලදී.<br>• සමාගමයේ හා කේවල් කිරීමේ නිදහස වර්ධනය කිරීම උදෙසා වෘත්තීය සමිති ඇති කර ගැනීමට, පවත්වාගෙන යාමට හා ඒ අනුව සිය අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කිරීමට සේවකයන් හට අවස්ථාව ලබා දී ඇත. ඒ අනුව 2024 වර්ෂය තුළදී වෘත්තීය සමිති 123ක් ලියාපදිංචි කරන ලදී. එම සමිතිද ඇතුළත්ව 2024.12.31 දිනට මෙරට වලංගු වෘත්තීය සමිති සංඛ්‍යාව 2141 කි . |

## 5.3 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිමේ අභියෝග

2024 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුව වෙත සිදු කරන ලද මූල්‍ය ප්‍රතිපාදන සහ දෙපාර්තමේන්තුව සතු සීමිත මානව සම්පත් සහ භෞතික සම්පත් කළමනාකරණය කර ගනිමින් තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම අභියෝගාත්මක විය.

# සයවන පරිච්ඡේදය

# මානව සම්පත් පැතිකඩ

# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2024.12.31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 217 | 126 | 91 |
| තෘතීය මට්ටම | 668 | 504 | 164 |
| ද්විතීය මට්ටම | 1928 | 1671 | 257 |
| ප්‍රාථමික මට්ටම | 476 | 410 | 66 |
| **එකතුව** | **3289** | **2711** | **578** |

## 6.2 දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තනතුරුවල මෙන්ම දෙපාර්තමේන්තුමය සහකාර කම්කරු කොමසාරිස්, නීති නිලධාරි, කම්කරු නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරි ආදී තනතුරුවල පවතින පුරප්පාඩු හේතුවෙන් අධීක්ෂණය, පරිපාලනමය කටයුතු, දෙපාර්තමේන්තුව විසින් අධිකරණයන්හි පවරනු ලබන නඩු කටයුතු කාර්යක්ෂම ඉටු කිරීම, ක්ෂේත්‍ර පර්යේෂණ සිදු කිරීම, පැමිණිලි විසඳීමේ කටයුතු කාර්යක්ෂම ඉටු කිරීම, සේවක අර්ථ සාධක අරමුදල් අංශයේ ප්‍රතිලාභ ගෙවීම් කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම ආදිය කෙරෙහි යම් බලපෑමක් සිදු කර ඇත.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

නිළධාරීන් වෙත දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන පුහුණු වැඩසටහන් තුළින් ඔවුන්ගේ වෘත්තීය දැනුම, හැකියාවන් සහ ආකල්ප වර්ධනය මෙන්ම ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේ ඵලදායීතාවය ප්‍රවර්ධනය ප්‍රධාන වශයෙන් අරමුණු වේ. එසේම දෙපාර්තමේන්තුව සතු සීමිත ප්‍රතිපාදන සහ සම්පත් මනා ලෙස කළමනාකරණය කර ගනිමින් නවීන තාක්ෂණය තම රාජකාරී කටයුතු සඳහා භාවිතා කිරීමට නිළධාරින් පෙළඹවීමද, මහජනතාවට වඩා සමීප සේවාවක් ලබාදීම සඳහා නිලධාරීන්ගේ භාෂා නිපුණතාවය වර්ධනයද, දෙපාර්තමේන්තුව තුළ ඵලදායී අන්තර් සම්බන්ධතා ගොඩනැගීමද මෙම පුහුණු වැඩසටහන් මගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, රාජ්‍ය සේවයේ අත්දැකීම් බහුල, කාර්යක්ෂම සහ තෘප්තිමත් නිලධාරි කණ්ඩායමක් බිහි කිරීම මෙම පුහුණු වැඩසටහන් මගින් සිදු කෙරේ.

2024 වර්ෂය තුළ දෙපාර්තමේන්තු නිලධාරීන් ගේ දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය පහත පරිදි වේ.

| වගුව 6. 1 - දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2024 | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අ. අ. | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම |
| | | තනතුර | සංඛ්‍යාව | | දේශීය | විදේශීය | | |
| සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් පවත්වන ලද වැඩසටහන් | | | | | | | | |
| 1 | සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ නව ක්‍රමවේදය සම්බන්ධයෙන් නිලධාරී පුහුණු වැඩසටහන | බස්නාහිර කලාප II හා III ට අයත් දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල අදාළ නිලධාරීන් | 18 | 2024.01.11 | 26,250.00 | | දේශීය | සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ නව ක්‍රමවේදය සම්බන්ධයෙන් අවශ්‍ය දැනුම ලබා දීම |
| 2 | නව කම්කරු නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන (Zoom මාධ්‍යයෙන් අදියර දෙකක් යටතේ පවත්වන ලදී) | සියලුම කම්කරු නිලධාරීන් | Zoom මාධ්‍යයෙන් පවත්වන ලද වැඩසටහනකි | 2024.02.08 | - | | දේශීය | කම්කරු නීති සම්බන්ධ නවතම සංශෝධන පිළිබඳව නිලධාරීන් දැනුවත් වීම |
| 3 | වැටුප් පරිවර්තනය හා සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | ආයතන අංශයේ සහ වැටුප් අංශයේ අදාළ විෂය භාර නිලධාරීන් | 34 | 2024.02.29 | 12,890.00 | | දේශීය | වැටුප් පරිවර්තනය හා සැකසීම පිළිබඳව නිලධාරීන් දැනුවත් වීම |
| 4 | නඩු ලේඛනය පවත්වාගෙනයාම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන | ශාඛා ප්‍රධානීන් සහ අදාළ භාර නිලධාරීන් | Zoom මාධ්‍යයෙන් පවත්වන ලද වැඩසටහනකි | 2024.04.17 | - | | දේශීය | නඩු ලේඛනය පවත්වාගෙනයාම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් වීම |
| 5 | කම්කරු කොමසාරිස් ගිණුම නිරවුල් කිරීම | ශාඛා ප්‍රධානීන් සහ අදාළ භාර නිලධාරීන් | Zoom මාධ්‍යයෙන් | 2024.04.25 | - | | දේශීය | කම්කරු කොමසාරිස් ගිණුම නිරවුල් කිරීම |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන | | පවත්වන ලද වැඩසටහනකි | | | | | සම්බන්ධයෙන් දැනුම වර්ධනය |
| 6 | පැමිණිලි කළමණාකරණ පද්ධතිය සම්බන්ධයෙන් සහ පෙත්සම් ලේඛනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන | කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලයන්හි, දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්හි හා උප කම්කරු කාර්යාලයන්හි අදාළ විෂයභාර නිලධාරීන් | Zoom මාධ්‍යයෙන් පවත්වන ලද වැඩසටහනකි | 2024.04.22 | - | | දේශීය | පැමිණිලි කළමණාකරණ පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සහ පෙත්සම් ලේඛනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් දැනුම වර්ධනය |
| 7 | නවක කම්කරු නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු වැඩසටහන | කම්කරු නිලධාරීන් | 57 | 2024.05.08 සිට 2024.09.06 | 2,329,850 | | දේශීය | රාජකාරි ඉටුකිරීම සඳහා අවශ්‍ය දැනුම සහ සේවාරම්භක පුහුණුව ලබා දීම |
| 8 | කම්කරු දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ නිලධරයන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන් මාලාව නේවාසික පුහුණු වැඩමුළුව (අදියර දෙකක් යටතේ පවත්වන ලදී) | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල්වරුන්, කම්කරු කොමසාරිස්වරුන්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), සහකාර කම්කරු කොමසාරිස්වරුන්, විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන්, | පළමු අදියර සඳහා නිලධාරීන් 35 ක්ද දෙවන අදියර සඳහා නිලධාරීන් 80 ක්ද සහභාගී විය | පළමු අදියර 2024.05.30 සිට 2024.06.01 දක්වා ද දෙවන අදියර 2024.08.29 සිට 2024.08.31 දක්වාද පවත්වන ලදී | 1,785,095.00 | | දේශීය | විධායක මට්ටමේ නිලධාරීන්ගේ නායකත්ව ගුණාංග, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියාව, උපායමාර්ගික තීරණ ගැනීමේ හැකියාව, සුපිළිපන් නිලධාරියෙකු සතු ගුණාංග ආදී මෘදු කුසලතා වර්ධනය කිරීම |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන්, කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන්, පර්යේෂණ නිලධාරීන්, ගණකාධිකාරීන්, සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) සහ නීති නිලධාරීන් | | | | | | |
| 9 | සේවක අර්ථසාධක අරමුදලේ 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහන | සියලුම කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලවල සේවය කරන අදාළ විෂය භාර නිලධාරීන් සහ කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ අදාළ විෂය භාර නිලධාරීන් | Zoom මාධ්‍යයෙන් පවත්වන ලද වැඩසටහනකි | 2024.08.08 | - | | දේශීය | සේවක අර්ථසාධක අරමුදලේ 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් සිදු කරනු ලබන ආකාරය සම්බන්ධයෙන් දැනුම වර්ධනය |
| 10 | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන (අදියර දෙකක් යටතේ පවත්වන ලදී) | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් විෂයට අදාළ සියළුම නිලධාරීන් | Zoom මාධ්‍යයෙන් පවත්වන ලද වැඩසටහනකි | 2024.07.31 දින සහ 2024.08.07 දින | - | | දේශීය | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැනුම වර්ධනය |
| 11 | භාණ්ඩ වට්ටෝරු ලේඛනය කළමනාකරණය, වාර්ෂික | සියලුම ප්‍රධාන කළමනාකරණ සේවා | Zoom මාධ්‍යයෙන් | 2024.08.06 | - | | දේශීය | භාණ්ඩ වට්ටෝරු ලේඛනය නඩත්තු කිරීම, |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | භාණ්ඩ සමීක්ෂණය සහ වෙන්දේසි සම්බන්ධ පුහුණු වැඩසටහන | නිලධාරීන් සහ අංශ ප්‍රධානීන් | පවත්වන ලද වැඩසටහනකි | | | | | භාණ්ඩ සමීක්ෂණය සහ වෙන්දේසි සිදු කිරීම සම්බන්ධ ක්‍රියාවලි පිළිබඳව දැනුම වර්ධනය |
| 12 | රියදුරු වගකීම් හා ආචාරධර්ම පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ රියදුරු සේවයේ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩමුළුව | සියලුම රියදුරන් | 65 | 2024.09.07 | 100,297.00 | | දේශීය | රියදුරු වගකීම් හා ආචාරධර්ම පිළිබඳව දැනුම ලබා දීම |
| 13 | කළමණාකරණ සේවා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන (උතුරු කලාපය සහ නැගෙනහිර කලාපය සඳහා වැඩසටහන් දෙකක් අදියර දෙකක් යටතේ සිදු කරන ලදී) | උතුරු කලාපයේ සංවර්ධන නිලධාරීන් සහ කළමණාකරණ සේවා නිලධාරීන් | 76 | 2024.10.12 සහ 2024.12.07 | 272,477.00 | | දේශීය | සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් ක්‍රියාවලිය සහ සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ දත්ත පද්ධතිය සම්බන්ධයෙන් දැනුම් වර්ධනය සහ මහජන සම්බන්ධතා පිළිබඳ කුසලතා වර්ධනය |
| 14 | ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ වැඩමුළුව | ප්‍රසම්පාදන කටයුතු විෂය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන නිලධාරීන් | 30 | 2024.12.10 | 65,995.00 | | දේශීය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව නිලධාරීන්ගේ දැනුම වර්ධනය |
| 15 | Training on Personal data protection and Cyber Security | තොරතුරු තාක්ෂණ ශාඛාවේ නිලධාරීන් | 18 | 2024.12.20 | 25,600.00 | | දේශීය | පරිගණක දත්ත ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය සහ ඒ හා සම්බන්ධ නීති පිළිබඳ දැනුම වර්ධනය |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 16 | කම්කරු නිලධාරින්ගේ කුසලතා සංවර්ධනය කිරීමේ පුහුණු වැඩමුළුව (සියලුම කලාප ආවරණය වන අයුරින් අදියර 07ක් යටතේ සිදු කරන ලදී) | කම්කරු නිලධාරීන් | 371 | 2024.08.21, 2024.10.05, 2024.10.09, 2024.10.19, 2024.10.23, 2024.11.23 සහ 2024.11.27 | 781,455.00 | | දේශීය | නායකත්ව කුසලතා, සන්නිවේදනය සහ මෘදු කුසලතා වර්ධනය සහ සුපසන් රාජ්‍ය සේවකයෙකුගේ ගුණාංග පිළිබඳව දැනුවත් කිරීම |
| **බාහිර පුහුණු ආයතනයන්හි පුහුණුව සඳහා නිලධාරීන් යොමු කිරීම්** | | | | | | | | |
| වැඩමුළු | | | | | | | | |
| 1 | පුස්තකාල සම්පත් ඩිජිටල්කරණය සහ එහි තාක්ෂණික ප්‍රවණතා පිළිබඳ එක්දින වැඩමුළුව | පුස්තකාලයාධිපති | 1 | | 2,500.00 | | දේශීය | පුස්තකාලයේ කටයුතු කාර්යක්ෂම වීම |
| 2 | විශේෂ සහ විශ්වවිද්‍යාල පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු අනුක්‍රමණිකාකරණය පිළිබඳ එක්දින වැඩමුළුව | පුස්තකාලයාධිපති | 1 | | 5,600.00 | | දේශීය | පුස්තකාලයේ කටයුතු කාර්යක්ෂම වීම |
| 3 | ලංසු ලියවිලි සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | ගණකාධිකාරිවරුන් සහ මුදල් අංශයේ විෂයභාර නිලධාරීන් | 4 | | 48,000.00 | | දේශීය | ලංසු ලියවිලි සැකසීමේ කටයුතු වඩා විධිමත් වීම |
| 4 | Government Payroll System(GPS) | ගණකාධිකාරී (වැටුප්) සහ මුදල් අංශයේ විෂයභාර නිලධාරීන් | 4 | | 72,000.00 | | දේශීය | Government Payroll System(GPS) හා |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 5 | විදේශ පුහුණු කටයුතු සඳහා නිවාඩු හා දීමනා ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන | ආයතන ශාඛාවේ සහකාර කම්කරු කොමසාරිස් සහ සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ විෂයභාර නිලධාරී | 2 | | 14,000.00 | | දේශීය | විදේශ පුහුණු සඳහා සහභාගීවන නිලධාරීන්ගේ නිවාඩු කටයුතු හා දීමනා ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳව දැනුම වර්ධනය |
| 6 | Roundtable on Strengthening Social Dialogue in Sri Lanka | කම්කරු කොමසාරිස්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්, සහකාර කම්කරු කොමසාරිස්වරුන් සහ කම්කරු නිලධාරීන් | 10 | | - (ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් පවත්වන ලද වැඩසටහනකි.) | | දේශීය | සමාජ කතිකාව ප්‍රවර්ධනය සඳහා දැනුම සහ අත්දැකීම් බෙදා ගැනීම |
| **ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි සඳහා යොමු කිරීම්** | | | | | | | | |
| 1 | ග්‍රාමීය සංවර්ධනය හා සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | සහකාර කම්කරු කොමසාරිස් | 1 | | 200,000.00 | | දේශීය | නිලධරයන්ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම |
| 2 | සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | සහකාර කම්කරු කොමසාරිස් | 2 | | 310,500.00 | | දේශීය | |
| 3 | නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | සහකාර කම්කරු කොමසාරිස් | 1 | | 250,000.00 | | දේශීය | |
| 4 | Msc. in Computer Science (Cyber Secuirity) | කළමනාකරණ සේවා නිලධාරි | 1 | | 450,000.00 | | දේශීය | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 5 | Msc in Occupational Safety & Health Management | විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු සහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | 5 | | 1,750,000.00 | | දේශීය | |
| 6 | තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ පාඨමාලාව | සහකාර කම්කරු කොමසාරිස් | 1 | | 87,500.00 | | දේශීය | |
| 7 | Process Safety and Asset Integrity | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | 1 | | 17,200.00 | | දේශීය | |
| 8 | Diploma in Networking and Cyber Security | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | | 45,000.00 | | දේශීය | |
| 9 | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලා | කම්කරු කොමසාරිස් සහ සහකාර කම්කරු කොමසාරිස් | 2 | | 81,000.00 | | දේශීය | |
| ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ පවත්වන ලද වැඩමුළු, සම්මන්ත්‍රණ සහ පුහුණු වැසටහන් | | | | | | | | |
| 1 | Law Reforms and International Labour Standards : South Asia Information and Knowledge Ledge Sharing Event | සහකාර කම්කරු කොමසාරිස්, නීති නිලධාරී සහ කම්කරු නිලධාරී | 3 | 2024.11.19 සිට 2024.11.21 දක්වා | - | - | දේශීය | අදාළ විෂයන් සම්බන්ධයෙන් අනෙකුත් රටවල Best Practices, ජාත්‍යන්තර ප්‍රමිති ආදිය පිළිබඳව දැනුම බෙදා ගැනීම |
| 2 | Labour Inspection in Sri Lanka (With Focus on Occupational Safety and | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ඉංජිනේරු), සහකාර | 63 | 2024.10.09 සිට 2024.10.11 | | | දේශීය | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | Health) | කම්කරු කොමසාරිස්වරුන්, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් සහ කම්කරු නිලධාරීන් | | දක්වා | | | | |
| 3 | Capacity Building Training on Collective Bargaining, Social Dialogue, Workplace Cooperation and Grievance Handling | නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්, සහකාර කම්කරු කොමසාරිස්වරුන්, සහ කම්කරු නිලධාරීන් | 30 | 2024.05.29 සිට 2024.05.30 දක්වා | | | දේශීය | |
| 4 | Training of Trainers in WIND and WISE Methodologies for Occupational Safety and Heaith | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් සහ පර්යේෂණ නිලධාරී | 8 | 2024.06.04 සිට 2024.06.06 දක්වා | | | දේශීය | |
| 5 | Dispute Resolution Diagnostic Workshop | කම්කරු කොමසාරිස් ජනරාල්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්, සහකාර කම්කරු කොමසාරිස්වරුන් සහ කම්කරු නිලධාරීන් | 22 | 2024.05.27 සිට 2024.05.28 දක්වා | | | දේශීය | |
| 6 | Validation Workshop on Unemployment Insurance Scheme in Sri Lanka | කම්කරු කොමසාරිස් ජනරාල්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්, සහකාර කම්කරු කොමසාරිස් | 5 | 2024.02.13 | | | දේශීය | |

| වගුව 6.2 - විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2024 | | | | | |
|---|---|---|---|---|---|
| අ. අ. | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය රු. |
| | | තනතුර | සංඛ්‍යාව | | |
| 01 | Tripartite High – Level Visit to to India for Strengthening Social Protection System in Sri Lanka From 13th -15th March 2024 | කම්කරු කොමසාරිස් ජනරාල් සහ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | 2 | 13.03.2024 සිට 15.03.2024 දක්වා | විදෙස් ආයෝජනයකි. |
| 02 | Asia Pacific Regional Meeting on Child Labour and Forced Labour 18 – 21 March 2024, Bangkok, Thailand | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | 1 | 18.03.2024 සිට 21.03.2024 දක්වා | විදෙස් ආයෝජනයකි. |
| 03 | Seminar on Social Security and Poverty Reduction for Developing Countries – from 23 May to 05 June 2024 | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | 1 | 23.05.2024 සිට 05.06.2024 දක්වා | විදෙස් ආයෝජනයකි. |
| 04 | Seminar on Capacity Building for Female Officials Participating in Social Management from Developing Countries | සහකාර කම්කරු කොමසාරිස්වරු | 2 | 04.06.2024 සිට 18.06.2024 දක්වා | විදෙස් ආයෝජනයකි. |
| 05 | Training Course on Productivity - Linked Wage Systems | සහකාර කම්කරු කොමසාරිස් | 1 | 01.07.2024 සිට 05.07.2024 දක්වා | විදෙස් ආයෝජනයකි. |
| 06 | Forth Mid - Career Training Programme for Island Services Officers of Sri lanka Under the Indian Technical & Economic Co-Operation (ITEC) 2024/2025 | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් සහ සහකාර කම්කරු කොමසාරිස් | 2 | 19.08.2024 සිට 30.08.2024 දක්වා | විදෙස් ආයෝජනයකි. |
| 07 | International Certificate Programme on Social Welfare Administration from 18th September to 08th October 2024 | සහකාර කම්කරු කොමසාරිස් | 1 | 18.09.2024 සිට 08.10.2024 දක්වා | විදෙස් ආයෝජනයකි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 08 | KOICA Capacity Building for Old - Age Income Scheme and National Pension Scheme Management in Korea | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | 1 | 22.09.2024 සිට 02.10.2024 දක්වා | විදෙස් ආයෝජනයකි. |
| 09 | Occupational and health Management for Asian Countries Under the Third Country Training Programme | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු | 2 | 14.10.2024 සිට 25.10.2024 දක්වා | විදෙස් ආයෝජනයකි. |
| 10 | The 19th meeting of Alliance 8.7's Global Coordinating Group, 5-6 December 2024 Turin, Italy and Online | කම්කරු කොමසාරිස් | 1 | 05.12.2024 සිට 06.12.2024 දක්වා | විදෙස් ආයෝජනයකි. |

# හත්වන පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2. | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3. | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් ( වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4. | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.5. | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6. | වෙනත් | අදාළ නොවේ | | |
| **2.** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම ( මු.රෙ. 445)** | | | |
| 2.1. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2. | පුද්ගල පඩි නඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3. | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4. | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5. | සියළු මාසික ගිණුම් සාරාංශය (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6. | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7. | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.8. | තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9. | හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10. | බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11. | උප පත්‍රිකා පොත් ලේඛණය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3.** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම ( මූ.රෙ. 135)** | | | |
| 3.1. | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම | අනුකූල වේ | | |
| 3.2. | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3. | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4. | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3. | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4. | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 4.5. | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1. | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | | |
| **6.** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1. | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2. | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | අදාළ කාර්යාල වලින් පිළිතුරු ලැබීමේදී මාසයකට වැඩි කාලයක් ගත වීම | අදාළ අංශ හා කාර්යාල දැනුවත් කිරීම |
| 6.3. | 2018 අංක 19 දරන ජාතික විගනණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4. | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1. | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **8.** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1. | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2. | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණය සඳහා නිලධාරියෙකු පත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.3. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5. | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9.** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1. | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. (සංචිත වාහන වල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සකස් කර ඇති අතර විගණකාධිපති උපදෙස් පරිදි අවශ්‍ය | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | | අවස්ථා වලදී විගණන අංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ.) | | |
| 9.2. | වාහන ගර්හිතවී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | වාහන අපහරණය කිරීම සඳහා මෝටර් රථ පරීක්ෂණ නිලධාරියෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කළ යුතු අතර එම කමිටුව පත් කර අපහරණ ක්‍රියාවලිය සඳහා යම් කාලයක් ගත වීම | වාහන අපහරණය සඳහා කමිටුවක් පත් කරන ලද අතර කමිටු සභාපති විසින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයා වෙනුවට වෙනත් පරීක්ෂකවරයෙකු පත් කිරීමට අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| 9.3. | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4. | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5. | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ (වාහන හයක ඉන්ධන පරීක්ෂාව සිදු කරන ලද අතර ඉතිරි වාහනවල ඉන්ධන | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | | පරීක්ෂාව 2025 වර්ෂයේදී සිදු කිරීමට කටයුතු යොදා ඇත) | | |
| 9.6. | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10.** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1. | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2. | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3. | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශ‍ේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කිරීම | අනුකූල වේ | | |
| **11.** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1. | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2. | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල වේ | | |
| **12.** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1. | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2. | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3. | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ | අනුකූල වේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | නිරවුල් කර තිබීම | (රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2024/01 අනුව හිඟහිටි ණය ශේෂ කපා හැර ඇත.) | | |
| **13.** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1. | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2. | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14.** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1. | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2. | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3. | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4. | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15.** | **ආදායම් ගිණුම** | | | |
| 15.1. | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාළ නොවේ | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 15.2. | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාළ නොවේ | | |
| 15.3. | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාළ නොවේ | | |
| **16.** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1. | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2. | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3. | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17.** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1. | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2. | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙඩ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3. | තොරතුරු දැන ගැනීමේ පනතේ 08වන වගන්තිය ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | ප්‍රාදේශීය කාර්යාල වෙත අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති අතර | ප්‍රාදේශීය කාර්යාල වෙතින් අදාළ තොරතුරු ලද වහාම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු යොදා |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | | | අවශ්‍ය සියලු තොරතුරු ලැබී නොතිබීම | ඇත. |
| **18.** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1. | අංක 05/2008 හා 05/2008(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2. | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19.** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම අත්සන් කර තිබීම | අනුකූල වේ<br><br>(2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(I) | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | | මගින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි (1) ඡේදය සංශෝධනය කර ඇත. වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බවත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/98, 08/98(i) හා 09/98(ii) මගින් හඳුන්වා දී ඇති කාර්ය සාධන ඇගයීම් ආකෘති පත්‍ර අර්ථපූර්ණ ලෙස යොදා ගන්නා ලෙසත් එම චක්‍රලේඛය මගින් දැනුම් දී ඇත. ඒ අනුව, අදාළ කාර්ය සාධන ඇගයීම් ආකෘති පත්‍ර භාවිතා කිරීමට කටයුතු කරන ලදී.) | | |

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20.** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1. | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

අවසානය.